



# 2014

## කාර්ය සාධන වාර්තාව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රීලංකාව

# දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ
# කාර්ය සාධන වාර්තාව

# 2014

ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## 2014 වසර තුළ කාර්ය සාධන සාරාංශය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) 2014 වසර තුළ රටේ සංවර්ධනය උදෙසා ආදායම් රැස්කිරීමේ රජයේ අරමුණ සඳහා සිය දායකත්වය ලබාදුන්නේ ය.

2014 වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද සමස්ත ආදායම කලින් වසරට වඩා රුපියල් මිලියන 21,622 ක වැඩිවීමක් වාර්තා කරමින් රු. මිලියන 514,161 ක් විය. එමගින් සමස්ත රජයේ ආදායමට 43.02% ක දායකත්වයක් ලබාදුන් අතර, වසර තුළ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය 5.25% ක් විය.

බදු අනුකූලතාවය ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීමේ සහ සවිබලගැන්වීමේ ක්‍රියාමාර්ග යන්නෙන් සමන්විත ඒකාබද්ධ යාන්ත්‍රණය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකි විය.

බදු ගෙවන්නන් විසින් රජයේ ආදායමට සහ ආර්ථිකයට දක්වන ලද මාහැඟි දායකත්වය හඳුනාගනිමින් ඔවුනට වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීමේ පැසසුම් ක්‍රියාවලිය වර්ෂය තුළ දී තවදුරටත් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදි.

අනෙක් අතට, බදු විගණන, හෙළිදරව් නොවූ ආදායම සහ පිරිවැටුම විධිමත් කිරීම මගින් වසර තුළ දී රුපියල් මිලියන 281,425 ක මුදලක් බදු වශයෙන් අයකර ගැනීමට හැකි විය. ඒ මත පදනම්ව වසර තුළ දී තක්සේරු කරන ලද අතිරේක බදු වටිනාකම රු. මිලියන 28,638 ක් විය.

පැහැර හරින ලද බදු අයකර ගැනීමේ පනතට අතිරේක වශයෙන්, බදු අයකර ගැනීම සඳහා අදාළ ප්‍රඥප්තීන්හි දක්වා ඇති පරිදි අවශ්‍ය කටයුතු සහ පියවර අඛණ්ඩව ගෙන ඇත.

ව්‍යවස්ථාවන් හි ඇතැම් විධිවිධාන සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් සහ උපදෙස් ලබාදීමට අතිරේක වශයෙන්, බදු නීති අර්ථනිරූපණය සඳහා වන කමිටුව විසින් වසර තුළ දී සිද්ධීන් 77 කට අදාළව අර්ථනිරූපණ ලබාදෙන ලදි.

තොරතුරු අංශය, බදු සේවා අංශය, සෙසු තක්සේරු අංශ සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ලබාදෙන ලද මූලික ක්‍රියාමාර්ග සමඟ සැලකිය යුතු අලුත් බදු ලිපිගොනු සංඛ්‍යාවක් විවෘත කර ඇත.

වර්ෂය තුළ දී උපකාර හා තොරතුරු අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුටම සහාය දැක්වීම සඳහා බදු සේවා අංශය අවශ්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව ශක්තිමත් කරන ලදි.

බදු ගෙවන්නන් මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දැනුවත් කරවීමේ අභිලාෂය පෙරදැරිව සම්මන්ත්‍රණ සහ දේශන කිහිපයක් සංවිධානය කරන ලදි.

වර්ෂය තුළ දී ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) මූලික වාර්තාව සහ ව්‍යාපෘති සැලසුම අවසන් කරන ලද අතර, අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

මූලික තොරතුරු හුවමාරු කරගැනීමෙන් අනතුරුව බාහිර ආයතන 23 ක් සමඟ සාකච්ඡා නිම කරන ලදි. ඒවා ව්‍යාපෘතිය යටතේ ජාලය හා සම්බන්ධ කිරීමට සැලසුම් කරනු ලබන අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට නියමිතය.

## දැක්ම

මනා පුහුණුවක් සහ කැපවීමක් සහිත කාර්ය මණ්ඩලයකින් යුතුව බදු ගෙවන ජනතාව උදෙසා මා හැඟි සේවයක් ඉටු කරන්නා වූ, බදු ගෙවන්නා කෙරෙහි හිතෛෂී බදු පරිපාලකයෙක් බවට පත් වීම.

## මෙහෙවර

බදු ගෙවීම කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාව දිරි ගැන්වීම මගින් මෙන්ම බදු ගෙවීම පැහැර හැරීම හා මග හැරීම වළක්වාලීම මගින් අදාළ බදු නීති හා අනෙකුත් අණපනත්වලට යටත්ව බදු අය කිරීම,

සහ

බදු හා ආශ්‍රිත ව්‍යවස්ථාවන් සාධාරණව, කඩිනම්ව, හා ආචාරශීලීව ක්‍රියාවට නැංවීම මගින් බදු ක්‍රමයේ අවංකභාවය හා කාර්යක්ෂමතාව කෙරෙහි මහජන විශ්වාසය පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

## ක්‍රමෝපායික ඉලක්ක

- ස්වේච්ඡාවෙන් බදු ගෙවීම කෙරෙහි අනුකූලතාවය දැක්වීම සඳහා බදු ගෙවන්නන් දිරි ගන්වන අතරම, ඊට අනුබල සැලසෙන වැඩ සටහන් ඔස්සේ බදු නීති රීති කෙරෙහි ඔවුන්ගේ ස්වේච්ඡා අනුකූලතාවය වැඩි දියුණු කිරීම හා එසේ අනුකූලතාවය නොදක්වන්නන් සොයා දැන අදාළ අවස්ථාවන්හි දී ඔවුනට එරෙහිව සුදුසු කටයුතු කිරීම.

- වැඩ කිරීමේ කාර්යක්ෂම ක්‍රම හා තාක්ෂණය යොදා ගැනීම මගින් සහ දැනට තිබෙන සම්පත් වඩා හොඳින් උපයෝගී කර ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

- දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත්කරගැනීම පෙරදැරිකරගෙන වඩාත් ඵලදායී අයුරින් දායකවීමට හැකිවනු පිණිස කළමනාකරණ හා තාක්ෂණික පුහුණුව මෙන්ම සේවා පළපුරුද්ද තුළින් කාර්යමණ්ඩලයේ ඵලදායීතාවය සහ වෘත්තීයමය බව ඉහළ නැංවීම.

# ප්‍රධාන නිලධාරීන්

| | |
|---|---|
| **ආර්.එම්.ආර්.ඩබ්. මංචනායක මහත්මිය** | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්** |
| **එල්. රාමනායක මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>බදු ප්‍රතිපත්ති උපදේශක - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය |
| **කේ. දහනායක මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>අධ්‍යක්ෂ ජනරාල් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය<br>තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| **කේ.ඒ.ජී. අභයරත්න මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>විමර්ශන, ප්‍රාදේශීය කාර්යාල සහ තොරතුරු |
| **ඩබ්. අනුලාවතී මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>බදු සේවා, අභියාචනා, මුද්දර ගාස්තු සහ රැඳවුම් බදු |
| **ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>මානව සම්පත් සහ මානව සම්පත් සංවර්ධන |
| **ඒ.එන්. ගුරුගේ මහතා** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>විශාල බදු ගෙවන්නන්ගේ අංශය, සංස්ථාපිත බදු I සහ II, ඔට්ටු සහ සූදු බදු |
| **පී. රෝහිණී මහත්මිය** | **නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්**<br>ප්‍රසම්පාදන සහ සැපයුම් |

## ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු

| | |
|---|---|
| ආර්.එම්.පී.එස්.කේ. රාජපක්ෂ මහත්මිය | බදු රැස්කිරීම සහ නිෂ්කාශනය, පැහැර හරින ලද බදු අයකර ගැනීමේ තොරතුරු |
| ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා | වක්‍ර බදු පරිපාලනය |
| ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මහත්මිය | බදු ප්‍රතිපත්ති, ක්‍රම සම්පාදන සහ සංවර්ධන, ජාත්‍යන්තර කටයුතු, ආයෝජන මණ්ඩල ව්‍යවසායන් |
| ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා | තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| ඩී.එම්.එස්. දිසානායක මහතා | විශාල බදු ගෙවන්නන්ගේ අංශය I |
| එම්.ජී. සෝමචන්ද්‍ර මහතා | මානව සම්පත් සංවර්ධනය |
| සී.එච්. වීරසිංහ මහත්මිය | අභ්‍යන්තර විගණන සහ තක්සේරු පාලනය |
| එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය | විශාල බදු ගෙවන්නන්ගේ අංශය II |
| පී.ජී.කේ. සමරතුංග මහතා | සංස්ථාපිත බදු II |
| එස්. කරුණාරත්න මහත්මිය | ලේකම් අංශය |
| ඕ.පී.පී.කේ. සිරිසේන මහතා | ප්‍රසම්පාදන සහ සැපයුම් |
| කේ. ධර්මසේන මහතා | විමර්ශන |
| බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය | මිල පැවරුම් නියෝග සහ අන්තර්ජාතික කටයුතු, කලාපI |
| ඩී.බී. දිසානායක මහතා | ජා.ගො.බ., ආ.සේ.ගා., ඔට්ටු සහ සූදු බදු, රැ.බ. (පොළිය මත) කලාප II |
| ඩී.ඩී.එන්.ජී. කෝරලේ ආරච්චි මහතා | මානව සම්පත් |
| ටී.එම්. දයානන්ද මහතා | තොරතුරු |

## වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද අණ පනත් අනුව පනවන ලද බදු පහත දැක්වේ:

| බද්ද | අදාළ අණ පනත් |
|---|---|
| ආදායම් බදු | 2002අංක 10, 2008 අංක 9 ,2009 අංක 19 2011 අංක 22, 2012 අංක 8, 2013 අංක 18 සහ 2014 අංක 8 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත |
| එකතු කළ අගය මත බදු, (මූල්‍යමය සේවා මත වූ එකතු කළ අගය මත බදු, එකතු කළ අගය මත වූ අත්තිකාරම් බදු විකල්ප එකතු කළ අගය මත බදු ඇතුළත්ව) | 2003අංක 07, 2004 අංක 13, 2005 අංක 06, 2006 අංක 08 සහ 49, 2007 අංක 14, 2008 අංක 15, 2009 අංක 15, 2011 අංක 09, 2012 අංක 7, 2013 අංක 17 සහ 2014 අංක 7 දරන පනත් මගින් සංශෝධිත පරිදි 2002 අංක 14 දරන එකතු අගය මත බදු පනත |
| ආර්ථික සේවා ගාස්තු | 2002අංක 15, 2008 අංක 11, 2009 අංක 16 , 2011 අංක 11, 2012 අංක 11, 2013 අංක 6 සහ 2014 අංක 9 දරන පනත් වලින් සංශෝධිත 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2002අංක 32, 2011 අංක 10, 2012 අංක 9, 2013 අංක 11 සහ 2014 අංක 10 දරන පනත් මගින් සංශෝධිත 2009 අංක 2 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත |
| ඔට්ටු හා සූදු බදු | 1288අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනත |
| මුද්දර ගාස්තු | 1282අංක 43 දරන මුද්දර ගාස්තු පනත සහ 2008 අංක 10 සහ 2011 අංක 13 දරන පනත් මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත |
| කොටස් ගණුදෙනු බද්ද<br>ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 2005අංක 05 දරන මුදල් පනත සහ 2007 අංක 13 දරන මුදල් පනත |
| සමාජ වගකීම් බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත, 2006 අංක 11 දරන මුදල් පනත සහ 2008 අංක 08 දරන මුදල් පනත |
| ඉඩම් පැවරීම මත බද්ද | 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත |

කලින් පනවනු ලැබ දැනට අවලංගු කර ඇති පහත සඳහන් බදු සම්බන්ධයෙන් තක්සේරු සහ අය කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කටයුතු කරන ලදී.

| බද්ද | අදාළ ප්‍රඥප්තිය |
|---|---|
| ජාතික ආරක්ෂක බද්ද | 1991අංක 52 දරන ජාතික ආරක්ෂක බද්ද, සංශෝධිත පරිදි |
| භාණ්ඩ හා සේවා බද්ද | 1996අංක 34 දරන භාණ්ඩ හා සේවා බදු පනත, සංශෝධිත පරිදි |
| ජාතිය රැක ගැනීමේ දායක බද්ද | 1996අංක 5 දරන ජාතිය රැක ගැනීමේ දායක බද්ද, සංශෝධිත පරිදි |
| ධන බද්ද මත අධිභාරය | 1982අංක 25 දරන ධන බද්ද අධිභාර පනත සහ 1989 අංක 8 දරන පනත |
| ආදායම් බදු මත අධිභාරය | 1984 අංක 12 දරන පනත සහ 1989 අංක 7 දරන පනත මගින් සංශෝධිත 1982අංක 26 දරන අදායම් බදු මත අධිභාර පනත |
| හර බද්ද | 2003 අංක 05, 2008 අංක 12, 2009 අංක 17 සහ 2011 අංක 14 යන පනත් මගින් සංශෝධිත 2002 අංක 16 දරන හර බදු පනත |
| බුදල් බද්ද | සංශෝධිත පරිදි 1980 අංක 13 දරන බුදල් බදු පනත |
| පිරිවැටුම් බද්ද ( උතුරු පළාත) | 1981අංක 69 දරන පිරිවැටුම් බද්ද, සංශෝධිත පරිදි |

## පටුන


**2014වසර තුළ කාර්ය සාධන සාරාංශය ........................................ iii**
**ප්‍රධාන නිලධාරීන් ........................................ vii**
**වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව මගින් අදාළ අණ පනත් යටතේ පරිපාලනය කරනු ලැබූ බදු ........................................ ix**
**පටුන ........................................ xi**
**කොටස I මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය ........................................ 1**
**පරිච්ඡේදය 1 මානව සම්පත් ........................................ 3**
1.1 සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව ........................................ 5
1.2 උසස් කිරීම් ........................................ 5
1.3 විශ්‍රාම ගැනීම් ........................................ 4
1.4 විනය ක්‍රියාමාර්ග ........................................ 5
1.5 පුහුණු කිරීම ........................................ 5
1.5.1 සේවාස්ථ පුහුණුව ........................................ 5
1.5.2 විදේශ පුහුණුව ........................................ 6
1.5.3 FMRP මගින් ලබාදෙන ලද විදේශ පුහුණු ........................................ 8
**කොටස II බදු පරිපාලනය ........................................ 9**
**පරිච්ඡේදය 2 ආදායම් රැස්කිරීම ........................................ 11**
2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව ........................................ 13
2.2 මුළු ආදායම් රැස්කිරීම ........................................ 14
2.3 මුළු ආදායම් ප්‍රවාහය ........................................ 15
2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම ........................................ 16
2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම ........................................ 16
2.6 ආදායම් රැස්කිරීම් ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම් - ........................................ 17
2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය ........................................ 17
2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය ........................................ 18
2.9 ආදායම් බදු රැස්කිරීම ........................................ 19
2.9.1 ආදායම් බදු රැස්කිරීම ආංශීය වශයෙන් පැහැදිලි කිරීම ........................................ 19
2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය ........................................ 20
2.9.3 ආදායම් බද්දට අදාළව ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් ........................................ 20
2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම. ........................................ 22
2.10.1 එකතු කළ අගය මත බදු කර්මාන්තය අනුව ව්‍යාප්තිය ........................................ 23
2.10.2 එකතු කළ අගය මත බදු වලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් ........................................ 24
2.11 ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රැස්කිරීම ........................................ 25
2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්: ........................................ 26
2.12 ආර්ථික සේවා ගාස්තු) ESC (රැස්කිරීම ........................................ 26
2.13 උපයන විට ගෙවීමේ බදු) PAYE (රැස්කිරීම ........................................ 26
2.14 රඳවා ගැනීමේ බදු) පොළිය සහ නිශ්චිත ගාස්තු මත( ........................................ 27
2.15 ඔට්ටු සහ සූදු බදු රැස්කිරීම ........................................ 27
2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම ........................................ 27
2.17 මුද්දර බදු රැස්කිරීම ........................................ 27
2.18 ඉඩම් පැවරීම මත බදු ........................................ 28
2.19 දේශීය ආදායම් රැස්කිරීම 2010 සිට 2014 දක්වා) බදු වශයෙන්( ........................................ 28
**පරිච්ඡේදය 3 වියදම් සහ ඵලදායිතා අනුපාතය ........................................ 29**
3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2102 ,2102 සහ 2102 වර්ෂ සමඟ සැසඳීම ........................................ 31
3.2 ඵලදායිතා අනුපාතය ........................................ 32
3.3 අභ්‍යන්තර විගණනය ........................................ 33
**පරිච්ඡේදය 4 පැහැර හරින ලද බදු ........................................ 35**
4.1 පැහැර හරින ලද බදු ........................................ 37
4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම් ........................................ 38
4.3 හිඟ බදු ප්‍රමාණය %3 මට්ටමෙහි පවත්වා ගැනීම ........................................ 38
**පරිච්ඡේදය 5 විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා ........................................ 39**
5.1 විගණන ........................................ 41
5.2 අභියාචනා ........................................ 41
5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන ........................................ 42
5.4 අය ක්‍රියාමාර්ග ........................................ 42
5.5 ආපසු ගෙවීම් ........................................ 42
**පරිච්ඡේදය 6 ජාත්‍යන්තර සබඳතා ........................................ 45**
6.1 ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් ........................................ 47
6.1.1 2014වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු ........................................ 48
6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන් ........................................ 48
**පරිච්ඡේදය 7 ව්‍යවස්ථා සම්පාදනය ........................................ 51**
7.1 වර්ෂය තුළදී පහත සඳහන් ව්‍යවස්ථාවන් පනවන ලදි ........................................ 53
7.2 අනුමත පුණ්‍යායතන ........................................ 53
7.3 ගැසට් නිවේදන ........................................ 53
7.4 අර්ථ නිරූපණ කමිටුව ........................................ 53
**පරිච්ඡේදය 8 අනෙකුත් කාර්යයන් ........................................ 55**
8.1 බදු සේවා අංශය ........................................ 57
8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතිකපත් පිළිබඳ විස්තර මතු දැක්වේ ........................................ 57
8.3 විශ්ලේෂණාත්මක වාර්තා ........................................ 57
8.4 පුහුණු අංශය ........................................ 57
8.5 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය) RAMIS( ........................................ 58

# කොටස I

# මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය

# පරිච්ඡේදය 1

# මානව සම්පත්

### 1.1 සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, සේවයේ යෙදී සිටි සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වෙන වගුව මගින් පෙන්නුම් කරයි.

2014.12.31 දිනට කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **දේශීය ආදායම් සේවය** | | | |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 7 | 2 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 22 | - |
| කොමසාරිස් | 90 | 88 | 2 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් | 1110 | 1020 | 90 |
| ජ්‍යෙෂ්ඨ බදු නිලධාරි/ බදු නිලධාරි | - | 105 | - |
| **අනෙකුත් සේවා** | | | |
| **ඒකාබද්ධ සේවය** | | | |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | - |
| ගණකාධිකාරී | 8 | 7 | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර (අධිශ්‍රේණිය) | 3 | 3 | - |
| භාෂා පරිවර්තක | 9 | 9 | - |
| පුස්තකාලයාධිපති I | 1 | 1 | - |
| පුස්තකාලයාධිපති III | 1 | - | 1 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 1000 | 540 | 460 |
| අයවැය සහකාර | 2 | 2 | - |
| ප්‍රවාහන නිලධාරී | 1 | - | 1 |
| රියදුරු | 74 | 74 | - |
| කාර්යාල සේවක සේවය | 319 | 297 | 22 |
| **තොරතුරු තාක්ෂණ සේවය** | | | |
| අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 6 | 4 | 2 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 12 | 11 | 1 |
| සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරී | 30 | 30 | - |
| **අනෙකුත්** | | | |
| ඉංජිනේරු | 1 | 1 | - |
| පර්යේෂණ සහකාර | 11 | 11 | - |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 3 | 1 |
| සැපයුම් සහකාර | 2 | - | 2 |
| තාක්ෂණ නිලධාරී | 2 | - | 2 |
| ගොඩනැගිලි අධීක්ෂක | 1 | - | 1 |
| ගබඩා භාරකරු | 2 | - | 2 |
| වඩු කාර්මික | 1 | 1 | - |
| **එකතුව** | **2724** | **2238** | **591** |

### 1.2 උසස් කිරීම්

- නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්, ආර්.එම්.ආර්.ඩබ්ලිව්. මංචනායක මහත්මිය 2014 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වශයෙන් පත්කරන ලදි.
- පහත සඳහන් ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් සහ කොමසාරිස්වරුන් වෙත නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්ගේ රාජකාරීන් පවරන ලදි.

| නම | ක්‍රියාත්මක දිනය |
|---|---|
| කේ. දහනායක මහත්මිය | 2014.01.01 |
| කේ.ඒ.පී. අභයරත්න මහතා | 2014.01.01 |
| ඩබ්ලිව්. අනුලාවතී මහත්මිය | 2014.01.01 |
| ආර්.එම්.ආර්.ඩබ්ලිව්.මංචනායක මහත්මිය | 2014.01.01 |
| ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා | 2014.01.01 |
| ඒ.එන්. ගුරුගේ මහතා | 2014.01.01 |
| පී.රෝහිණී මහත්මිය | 2014.01.01 |

- කොමසාරිස්වරුන් විසි දෙදෙනෙකු (22) ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.
- නියෝජ්‍ය කොමසාරිස්වරුන් විසි නව දෙනෙකු (29) කොමසාරිස් ධූරයට උසස් කරන ලදි.

### 1.3 විශ්‍රාම ගැනීම්

පහත නම් සඳහන් නිලධාරීන් වසර තුළ දී විශ්‍රාම ගැනීමට යෙදුනි.

- මල්ලිකා සමරසේකර මහත්මිය
  කොමසාරිස් ජනරාල්
- එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා
  අතිරේක කොමසාරිස් ජනරාල්
- කේ.ඒ.පී. කලුආරච්චි මහතා
  නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්
- පී.කේ. පද්මනාදන් මහතා
  කොමසාරිස්
- එම්.එච්.එන්. අමරකෝන් මහතා
  කොමසාරිස්

**අනෙකුත් විශ්‍රාම ගැනීම්**

- සහකාර කොමසාරිස් - 06
- ප්‍රධාන ගණකාධිකාරී - 01
- රාජ්‍ය කළමනාකරණ සහකාර - 03
- කාර්යාල කාර්ය සහායක - 06

**<u>මල්ලිකා සමරසේකර මහත්මිය</u>**

එම්. සමරසේකර මහත්මිය 2011 වසරේ දෙසැම්බර් මස 26 වන දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් වශයෙන් පත්කරන ලදි. 1978 වසරේ දෙසැම්බර් මස 01 වන දින තක්සේරුකාරිනියක ලෙස දෙපාර්තමේන්තුවේ තම වෘත්තීය සේවා කාලය ආරම්භ කළ ඇය බදු පරිපාලන ක්ෂේත්‍රයේ සුවිශේෂී තනතුරු කිහිපයක් හෙබ වූවා ය. සමරසේකර මහත්මිය, වසර 35 ක් පමණ වූ ඇයගේ ධූර කාලය තුළ දී විවිධ පුහුණු වැඩසටහන් වලට මෙන්ම, 1990 වසරේ ජපානයේ පැවති බදුකරණ පාඨමාලාව, 2011 වසරේ මලයාසියාවේ පැවති මලයාසියානු පොදු බදු පරිපාලන පාඨමාලාව, 2006 වසරේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වෙමින් පවත්නා රටවල බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය පිළිබඳ ප්‍රායෝගික ගැටළු සම්බන්ධ පුහුණු පාඨමාලාව සහ 2010 වසරේ කොරියාවේ පැවති ආදායම් පරිපාලනය සහ භාණ්ඩාගාර කළමනාකරණ තෙරතුරු පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන ඇතුළු විදේශ බදුකරණ වැඩසටහන් රැසකට සහභාගී වූවා ය. එසේම 2006 වසරේ ජපානයේ සහ 2010 වසරේ ඉන්දියාවේ පැවති බදු සම්මන්ත්‍රණ සඳහා ද, 2012 වසරේ මලයාසියාවේ පැවති ආසියානු බදු බලධාරීන්ගේ සාකච්ඡා සමුළුව සහ 2012 වසරේ මෝල්ටාහි පැවති බදු පරිපාලකයින්ගේ පොදු රාජ්‍ය මණ්ඩලීය සංගමයේ 33 වන වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය වෙනුවෙන් ද දෙපාර්තමේන්තුව නියෝජනය කළා ය. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ඇතුලුව ආදායම් පරිපාලනය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් කිහිපයක් ඇයගේ කොමසාරිස් ජනරාල් ධූර කාලය තුළදී ආරම්භ කරන ලදි.

**<u>එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා</u>**

එච්.බී.ඒ. සෙනෙවිරත්න මහතා 1978 වසරේ දී තක්සේරුකරුවකු ලෙස දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය. 2014.03.19 දින ඔහු විශ්‍රාම ගන්නා කාලවකවානුවේ දී ඔහු අතිරේක කොමසාරිස් ජනරාල්වරයෙකු ලෙස කටයුතු කරමින් සිටියේය. සෙනෙවිරත්න මහතා, දේශීය ආදායම් සේවයේ විවිධ තනතුරු හොබවමින් දෙපාර්තමේන්තුව වෙනුවෙන් වසර 36 ක කැපවුණු සේවා කාලපරිච්ඡේදයක් නිම කර තිබිණි. ඔහුගේ ධූරකාලය තුළ පුහුණු වැඩසටහන් වලට මෙන්ම, 1992 ජපානයේ පැවති බදුකරණය පිළිබඳ සමුළුව, 1999 වසරේ ඇ.එ. ජනපදයේ පැවති බදු ප්‍රතිපත්ති විශ්ලේෂණය පිළිබඳ තාක්ෂණික ශක්‍යතා ඉහළ නැංවීම සම්බන්ධ වැඩසටහන, 2003 වසරේ මලයාසියාවේ පැවති අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ බදුකරණය සම්බන්ධ පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ සංගමයේ වැඩමුළුව OECD බදුකරණය පිළිබඳ ලෝක සංසදය, 2004 වසරේ අංශයේ පැවති 9 වන වාර්ෂික බදුකරණ රැස්වීම, 2005 වසරේ පැරිසියේ පැවති බදු සම්මුතීන් පිළිබඳ 10 වන වාර්ෂික අන්තර්ජාතික බදුකරණ රැස්වීම, නයිජීරියාවේ පැවති 31 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය සහ 2012 වසරේ මෝල්ටාහි පැවති පොදුරාජ්‍ය මහද්වීප සංගමයේ බදු

පරිපාලකයින්ගේ කළමනාකරණ කමිටු රැස්වීම ඇතුළු විදේශ බදුකරණ වැඩසටහන් රැසක් වෙනුවෙන් සහභාගී වූයේ ය. සෙනෙවිරත්න මහතා සවුදි අරාබිය, ලක්ෂම්බර්ග්, සිංගප්පූරුව, පින්ලන්තය බෙරුලස් සහ පෝලන්තය ඇතුළු සම්මුති සාකච්ඡාවන්හි දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය. සෙනෙවිරත්න මහතා ඔහුගේ ධූර කාලය තුළ දී ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් සඳහා සියලුම සම්මුති සාකච්ඡාවන්හි දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන බදු ව්‍යවස්ථාවන් විධිවිධානයන් අර්ථ නිරූපණය සඳහා වගකියන ලද බදුකරණය අර්ථ නිරූපණය කිරීමේ කමිටුවේ පළමු සභාපති ලෙසද ඔහු කටයුතු කළේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් අභ්‍යන්තර පුහුණු වැඩසටහන්වල දී ඔහු සුවිශේෂී සේවාවක් ඉටු කළේය. මෙයට අතිරේක වශයෙන් ඔහු පිළිවෙළින් 2011 වසරේ සහ 2012 වසරේ ශ්‍රී ලංකාවේ පැවති CATA සමුළුව සහ SAARC පුහුණු වැඩසටහන් දෙකම මෙහෙයවීමෙහි ලා ප්‍රමුඛත්වය ගෙන ක්‍රියා කළේය.

**<u>කේ.ඒ.පී. කළුආරච්චි මහතා</u>**

1980 වසරේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වූ කේ.ඒ.පී. කලුආරච්චි මහතා 2011 ජනවාරි 01 වන දින නියෝජ්‍ය කොමසාරිස් ධූරයට පත් විය. ඔහු 2014 දෙසැම්බර් 08 වන දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි. කේ.ඒ.පී. කළුආරච්චි මහතා තම ධූර කාලය තුළ පුහුණු වැඩසටහන් වලට මෙන්ම 1999 වසරේ ඇ.එ. ජනපදයේ පැවති බදු ප්‍රතිපත්ති විශ්ලේෂනයෙහි ලා තාක්ෂණික ශක්‍යතාවය ඉහළ නැංවීම පිළිබඳ පුහුණු වැඩසටහන, 2007 වසරේ ඉන්දියාවේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය පිළිබඳ ප්‍රායෝගික ගැටළු පිළිබඳ පුහුණු වැඩසටහන, 2007 වසරේ ඉන්දියාවේ NADT හි පැවති විමර්ශනය සහ කළමනාකරණය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන සහ 2013 වසරේ සිංගප්පූරුවේ පැවති ඊ - යහපාලනය සහ පරිවර්තන කළමනාකරණය (E – Governance & Change Management) පිළිබඳ පුහුණු වැඩසටහන ඇතුළු විදේශ බදුකරණ වැඩසටහන් රැසකට සහභාගී වූයේය. එසේම ඔහු 2010 වසරේ නයිජීරියාවේ පැවති 31 වන (CATA) පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ සංගමයේ වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය, 2012 වසරේ ඇ.එ. ජනපදයේ පැවති අන්තර් ජාතික මුල්‍ය සංගමයේ 66 වන සමුළුව සහ 2013 වසරේ රුවන්ඩාවේ පැවති 34 වන CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය ඇතුළු විදේශ වැඩසටහන් කිහිපයක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව නියෝජනය කළේය. ඔහු දීර්ඝ කාලයක සිට සංස්ථාපිත බදු පරිපාලන ක්‍රියාවලියෙහි ලා අනගි සේවාවක නිරත වූයේය.

## 1.4 විනය ක්‍රියාමාර්ග

| සේවාගණය | තක්සේරු කරු | බදු නිලධාරී |
|---|---|---|
| 2014.01.01 දිනට ඉතිරිව තිබූ සිද්ධීන් | 9 | - |
| වර්ෂය තුළ ආරම්භ කරන ලද සිද්ධීන් ගණන | 1 | - |
| වර්ෂය තුළ අවසන් කරන ලද සිද්ධීන් ගණන | - | - |
| 2014.12.03 දිනට නිම කිරීමට ඉතිරිව තිබූ සිද්ධීන් ගණන | 10 | - |

## 1.5 පුහුණු කිරීම

### 1.5.1 සේවාස්ථ පුහුණුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය විශේෂයෙන්ම බදුකරණය සහ ගිණුම්කරණය පිළිබඳව දැනුම ඉහළ නැංවීම සහ විශ්ලේෂණාත්මක හැකියාව ඔප්නැංවීම අපේක්ෂාවෙන් තක්සේරුකරුවන් සහ බදු නිලධාරීන් වෙනුවෙන් පුහුණු පාඨමාලාවන් සහ විභාග නිරන්තරයෙන් පවත්වනු ලැබේ. නිලධාරීන්ගේ අදාළ ශ්‍රේණිවල ස්ථිර කිරීමට අවශ්‍ය විවිධ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහාත් රාජකාරී ඉටුකිරීම සඳහා දැනුම ලබාගැනීම සඳහාත් අවශ්‍ය කෙරෙන විෂයය අරමුණු කොටගෙන මෙම පුහුණු පාඨමාලා සකසා ඇත. වසර තුළ දී පුහුණු කරන ලද සහ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පරීක්ෂණවල විස්තර පහත පරිදි දැක්වේ.

- නියෝජ්‍ය කොමසාරිස්වරුන් සහ සහකාර කොමසාරිස්වරුන් සඳහා (DC and AC)

| පාඨමාලාව/පරීක්ෂණය | පුහුණුකරුවන්ගේ සංඛ්‍යාව | |
|---|---|---|
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පවත්වන ලද පුහුණු පංති | 04 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා වූ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සඳහා පවත්වන ලද පුහුණු පංති | 60 | |
| නියෝජ්‍ය කොමසාරිස් සහ සහකාර කොමසාරිස්වරුන් සඳහා පරිගණක පාදක ගිණුම්කරණ පැකේජය සම්බන්ධ නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන | 64 | |
| II ශ්‍රේණියේ II පංතියේ තක්සේරුකරුවන් සඳහා පවත්වන ලද දෙවන දෙපාර්තමේන්තු විභාගය | පළමු ප්‍රයත්නය | 04 |

- **සම්මන්ත්‍රණ, වැඩමුළු යනාදිය**

වසර තුළදී නියමිත පුහුණු වැඩසටහන් වලට අමතරව බදු නීතය සහ අදාළ මාර්ගෝපදේශ පිළිබඳව විශේෂ දැනුමක් ලබා දීම සඳහා වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලදි.

| විෂය | වසර තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු ගණන | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| සේවාන්ත ප්‍රතිලාභ පිළිබඳ උපදෙස් සහිත නව උපයන විට ගෙවීමේ (PAYE) වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන | 1 | 150 |
| විගණන සිදුකිරීමේ දී බදු ගෙවන්නන් සමඟ නිර්මාණශීලී ඵලදායී අන්තර් සබඳතාවය | 1 | 42 |
| මිල පැවරුම්, අසම්බන්ධිත මිල නිශ්චය කිරීම | 1 | 52 |
| පරිගණකගත කරන ලද ගිණුම්කරණ පරිසරයක් තුළ ක්ෂේත්‍ර විමර්ශනය | 1 | 72 |
| මිල පැවරුම් | 1 | 46 |
| I F R S | 1 | 53 |
| අන්තර්ජාතික බදුකරණය | 1 | 53 |

## 1.5.2 විදේශ පුහුණුව

බදු පරිපාලකයින් වශයෙන් නිලධාරීන්ගේ වෘත්තීමය මට්ටම් පවත්වාගෙන යාම පිණිස වෙනත් රටවල බදු නීති පරිපාලනය සහ මනා පරිචයන්හි කරන ලද ප්‍රගමනයන්ට ඔවුන් නැඹුරු කරවීමේ අරමුණ පෙරදැරිව විදේශයන්හි පැවති පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගීවීමට ඉඩ සැලසෙන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලදි.

එසේ විදේශයන් සඳහා යවන ලද නිලධාරීන් සහ ඔවුන් සහභාගි වූ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩසටහනේ/සම්මන්ත්‍රණයේ/ වැඩමුළුවේ නම | පුහුණුව ලැබූ රට | |
|---|---|---|---|---|
| 01 | කේ. දහනායක මහත්මිය<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ආසියානු රටවල් සඳහා 5 වන ඉහළ මට්ටමේ බදු සම්මන්ත්‍රණය | ජපානය | 21.04.2014 - 23.04.2014 |
| 02 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | මානව සම්පත් පරිවර්තනය; මානව සම්පත් සහ සංවිධානය අතර බැඳීම මෙහෙයවීම | එක්සත් රාජධානිය | 07.07.2014-11.07.2014 |
| 03 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ඊ - යහපාලන පුහුණු වැඩසටහන සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | මලයාසියාව | 07.09.2014-09.09.2014 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | ඒ.එන්. ගුරුගේ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ආසියානු බදු අධිකාරීන්ගේ සංසදය | ඉන්දුනීසියාව | 03.06.2014-<br>05.06.2014 |
| 05 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 06 | ඩී.ජී.පී.ඩබ්ලිව්. ගුණතිලක මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | උසස් මිල පැවරුම් සිද්ධි අධ්‍යයනය | මලයාසියාව | 01.12.2014-<br>05.12.2014 |
| 07 | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා<br>නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | E – Governance පුහුණු වැඩසටහන සම්බන්ධ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | මලයාසියාව | 07.09.2014-<br>09.09.2014 |
| 08 | පී.ජී.කේ. සමරතුංග මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | සජීවීකරණ ලෝක ආර්ථිකයේ VAT අනාගතය පිළිබඳව සම්මන්ත්‍රණය | ඉන්දුනීසියාව | 24.09.2014 -<br>26.09.2014 |
| 09 | ඕ.පී.පී.කේ. සිරිසේන මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ආසියානු බදු අධිකාරීන්ගේ සංසදය | | 03.06.2014-<br>05.06.2014 |
| 10 | බී.ඒ.ඩී.ඩී. හේරත් මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මූලික ක්ෂයවීම සහ ලාභ විතැන්වීම | කොරියාව | 20.02.2014 -<br>21.02.2014 |
| 11 | ඩී.බී. දිසානායක මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 12 | කේ.ඩී.ඒ.පී. කෝරලේආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | IRBD – OECD: MAC සහ ස්වයංක්‍රීය EOI සුවිශේෂ වාසි ලබාගැනීම | මැලේසියාව | 17.02.2014 -<br>21.02.2014 |
| 13 | කේ.ඩී.ඒ.පී. කෝරලේආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මානව සම්පත් පරිවර්තනය; මානව සම්පත් සහ සංවිධානය අතර බැඳීම මෙහෙයවීම | එක්සත් රාජධානිය | 07.07.2014-<br>11.07.2014 |
| 14 | කේ.ඩී.ඒ.පී. කෝරලේආරච්චි මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 15 | පී.එල්.එස්. ලියනගේ මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මූලික ක්ෂයවීම සහ ලාභ විතැන්වීම | කොරියාව | 20.02.2014 -<br>21.02.2014 |
| 16 | ජේ. රත්නායක මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 17 | ටී.එස්. සොයිසා මහතා<br>ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 18 | එම්.ජී. ගුණසිරි මහතා<br>කොමසාරිස් | බදු පරිපාලනය පිළිබඳ දැනුම බෙදාගැනීමේ වැඩමුළුව | පිලිපීනය | 10.06.2014-<br>11.06.2014 |
| 19 | ඩී.එම්.පී. ගනේපොල මහත්මිය<br>කොමසාරිස් | ඒකාබද්ධ IRBM – OECD උසස් විගණනය - කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය | මලයාසියාව | 05.05.2014-<br>09.05.2014 |
| 20 | එම්.එල්.එම්. තහීර් මහතා<br>කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-<br>14.11.2014 |
| 21 | යූ.පී.එස්.ඒ. ජයලත් මහතා<br>කොමසාරිස් | බදු පරිපාලනය පිළිබඳ දැනුම බෙදාගැනීමේ වැඩමුළුව | පිලිපීනය | 10.06.2014-<br>11.06.2014 |
| 22 | එම්.ඩී.ජේ.එම්. දේවප්‍රිය මහතා<br>කොමසාරිස් | IRBM – IBFD මූල්‍ය වෙළෙඳපොළේ බදුකරණය | මලයාසියාව | 25.08.2014 -<br>29.08.2014 |
| 23 | ටී. කරුණාදාස මහතා<br>කොමසාරිස් | ඒකාබද්ධ IRBM – OECD උසස් විගණන බහුජාතික ව්‍යවසායන් | මලයාසියාව | 07.04.2014-<br>11.04.2014 |
| 24 | ඩී.යූ.ඒ. ජයවර්ධන මහතා<br>කොමසාරිස් | E – Governance පුහුණු වැඩසටහන පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම | මලයාසියාව | 07.09.2014-<br>09.09.2014 |
| 25 | ආර්.කේ.සී. චිත්‍රලතා මහත්මිය<br>කොමසාරිස් | තොරතුරු හුවමාරුව සහ විශාල බදු ගෙවන්නන්ගේ අංශය පිළිබඳ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්ථානය | 7.04.2014-<br>11.04.2014 |

| | | | | |
|---|---|---|---|---|
| 26 | එම්. ගනේෂ්රාජා මහතා කොමසාරිස් | 35 වැනි CATA වාර්ෂික තාක්ෂණික සම්මන්ත්‍රණය | බොට්ස්වානා | 10.11.2014-14.11.2014 |
| 27 | එස්. ලියනගේ මහත්මිය කොමසාරිස් | නිෂ්කර්ශන කර්මාන්තයේ මිල පැවරුම් ප්‍රතිලාභයන් | මලයාසියාව | 22.09.2014-26.09.2014 |
| 28 | ආර්.පී.එච්. ප්‍රනාන්දු මහත්මිය කොමසාරිස් | IRBM – OECD උසස් මිල පැවරුම් - සිද්ධි අධ්‍යයනය | මලයාසියාව | 1.12.2014-5.12.2014 |
| 29 | එන්.එම්.ඒ.කේ.බී. නාපාන මහතා නියෝජ්‍ය කොමසාරිස් | කළමනාකරණ ශක්‍යතා සාක්ෂාත් කරගැනීම | එක්සත් රාජධානිය | 28.07.2014 - 07.09.2014 |
| 30 | එම්.ඒ. ප්‍රියංක මහතා නියෝජ්‍ය කොමසාරිස් | MPM දෙවන රාජ්‍ය අධ්‍යයන සංචාරය | මලයාසියාව | 18.05.2014 - 31.05.2014 |
| 31 | ශ්‍රියානි ජයසිංහ මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් | බදු විශ්ලේෂණය සහ ආදායම් පුරෝකථනය | අමෙරිකා එක්සත් ජනපදය | 22.06.2014 - 18.07.2014 |
| 32 | එච්.එස්.ජේ. රණසිංහ මහතා නියෝජ්‍ය කොමසාරිස් | බදු විශ්ලේෂණය සහ ආදායම් පුරෝකථනය | අමෙරිකා එක්සත් ජනපදය | 22.06.2014 - 18.07.2014 |
| 33 | එන්.ඩබ්.පී.ඒ.එස්. නානායක්කාර මහතා - සහකාර කොමසාරිස් | පොදු රාජ්‍ය මණ්ඩලීය බදු පරිපාලකයින්ගේ පාඨමාලාව | එක්සත් රාජධානිය | 28.07.2014-05.09.2014 |
| 34 | පී.ජී. ලලිත් මහතා සහකාර කොමසාරිස් | තොරතුරු හුවමාරුව සහ විශාල බදු ගෙවන්නන්ගේ අංශය පිළිබඳ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්තානය | 07.04.2014 - 11.04.2014 |
| 35 | ඒ.කේ. හෙට්ටිආරච්චි මහතා සහකාර කොමසාරිස් | තොරතුරු හුවමාරුව සහ විශාල බදු ගෙවන්නන්ගේ අංශය පිළිබඳ SAARC පුහුණු සම්මන්ත්‍රණය | පකිස්තානය | 07.04.2014 - 11.04.2014 |
| 36 | පී.ටී.ටී.ලී. ජයසිංහ මහතා සහකාර කොමසාරිස් | උසස් විගණන - බහු ජාතික ව්‍යවසායන් | මලයාසියාව | 07.04.2014 - 11.04.2014 |

### 1.5.3 FMRP මගින් ලබාදෙන ලද විදේශ පුහුණු

FMRP හි අනුග්‍රහය යටතේ සිංගප්පූරුවේ දී පවත්වන ලද ඊ - යහපාලනය සහ කළමනාකරණ පරිවර්තනය (E – Governance & Change Management) හා සම්බන්ධ පුහුණු වැඩසටහන මෙම වසර තුළදී පවත්වන ලදි. ඒ අනුව, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හා සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන සඳහා නිලධාරීන් 291 දෙනෙකු සහභාගී වන ලදි.

# කොටස II
# බදු පරිපාලනය

# පරිච්ඡේදය 2

# ආදායම් රැස්කිරීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂය තුළ දී රු.514,160,713,222 ක ශුද්ධ ආදායම් ප්‍රමාණයක් රැස් කර ඇත. (ඊට මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත වන සමාජ වගකීම් බද්ද, පළාත් සභාවලට මුළුමනින්ම මාරු කරනු ලබන මුද්දර බද්ද සහ පළාත් සභාවලට මාරු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්ද යන රැස්කිරීම් වලින් 1/3 ක කොටස ද ඇතුළත් වේ.) විවිධ බදු රැස්කිරීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු සංඛ්‍යාවේ එකතුව 2014.12.31 දින වන විට 625,376 ක්ව පැවතිණි.

## 2.1 බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව

වසර අවසාන වන විට බදු ගෙවීම සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ තැනැත්තන් සංඛ්‍යාව පහත අංක 01 වගුවෙහි දක්වා ඇත.

| වගුව 01 – 2014.12.31 දිනට බදු ගෙවන්නන් සහ බදු ලිපිගොනු සංඛ්‍යාව | | |
|---|---|---|
| **ආදායම් බද්ද** | | |
| ***සංස්ථාපිත*** | | |
| වාසික සමාගම් | 38,502 | |
| නිර්වාසික සමාගම් | 969 | |
| රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු ආයතන | 64 | 39,535 |
| ***සංස්ථාපිත නොවන*** | | |
| පුද්ගලයින් | 148,720 | |
| හවුල් ව්‍යාපාර | 14,515 | |
| පුද්ගල මණ්ඩල ආදිය | 1,832 | |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තයන් (2014.03.31) දිනට* | 354,758 | 519,825 |
| **ආදායම් බදු ගෙවන මුළු සංඛ්‍යාව** | | **559,360** |
| ***අනෙකුත් බදු ගෙවන්නන්*** | | |
| ආර්ථික සේවා ගාස්තු (ESC) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර | 3,515 | |
| එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 15,330 | |
| මුල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 176 | |
| වෛකල්පිත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 74 | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 22,381 | |
| මුල්‍ය සේවා **මත** ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 175 | |
| ඔට්ටු බදු ලිපිගොනු සංඛ්‍යාව | 1,067 | |
| සුදු බදු ලිපිගොනු සංඛ්‍යාව | 5 | |
| **මුළු අනෙකුත් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **42,723** |
| උ.වි.ගෙ. ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සේවා යෝජකයන් | 12,104 | |
| පොළිය මත රඳවාගැනීමේ බදු (රඳවාගැනීමේ නියෝජිතයන්) | 2,628 | |
| නිශ්චිත ගාස්තු යටතේ රඳවාගනීමේ බදු (විධිමත් මාසික උපලේඛන සැපයුම්කරුවෝ) | 84 | |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 304 | |
| මුද්දර බදු (විධිමත් මාසික උපලේඛනගත සැපයුම්කරුවන්) | 8,173 | **23,293** |
| **2014.12.31 දිනට මුළු ලිපිගොනු/බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව** | | **625,376** |

** රජයේ සේවකයන් 45,778 ක සංඛ්‍යාවක් ඇතුළත් වන අතර, සේවා යෝජකයින් විසින් සපයන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවා නියුක්තිකයින් ගණන ඇතුළත් නොවේ.*

**සටහන්:**

i වෙනත් ආදායමක් නොමැති නම් උ.වි.ගෙ. ක්‍රමය යටතේ පාරිශ්‍රමිකයෙන් බදු අඩු කරගත් යම් සේවා නියුක්තිකයෙකු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් දෙපාර්තමේන්තුවෙහි වෙනම ලිපිගොනුවක් පවත්වාගෙන යනු නොලැබේ.

ii අවසාන බද්දක් ලෙස ප්‍රභවය මත ආදායම් බදු අය කරනු ලබන පුද්ගලයින් (තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළිය, ලාභාංශ ආදිය) සංස්ථාපිත නොවන ලිපිගොනු යටතේ ඇතුළත් කොට නොමැත.

iii ඉහත ආදායම් බදු ලිපිගොනු අතර රාජ්‍ය නොවන සංවිධාන සඳහා ලිපිගොනු 122 ක් ද ඇතුළත් වේ.

## 2.2 මුළු ආදායම් රැස්කිරීම

වර්ෂය සඳහා මුළු ආදායම් රැස්කිරීම රුපියල් මිලියන 514,161 ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 21,622 ක ඉහළ යාමක් පෙන්නුම් කරයි. අනුකූලතාව වර්ධනය සඳහා පහසුකම් සැලසීමට සහ බලාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලනය විසින් ගන්නා ලද පුළුල් ක්‍රියා මාර්ග හේතුකොටගෙන ප්‍රධාන වශයෙන් ම මෙම ජයග්‍රහණයන් සාක්ෂාත්කර ගැනීමට හැකි විය. බදු ගෙවන්නන් හඳුනාගැනීම, බදු බැඳියාවන් තක්සේරු කිරීම සහ බදු රැස්කිරීම කඩිනම් කිරීම තුළින් ඉහත සඳහන් කරන ලද වැඩිවීම කෙරෙහි මග පෑදිනි.

රජයේ ආදායමට වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැරූ දායකත්වයෙහි ප්‍රතිශතය 43.02% කි. අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ගය යටතේ වන ආදායම සසඳා බැලූ විට, ආදායමේ මුළු රැස්කිරීම, 84.23% ක සාධනීය තත්ත්වයක් පෙන්වයි.

එකතු කළ අගය මත බදු රැස්කිරීම පෙර වසරට සාපේක්ෂව රුපියල් මිලියන 20,228 කින් වැඩි විය. එසේ වැඩිවීම සඳහා හේතුව තොග සහ සිල්ලර වෙළෙඳාම සඳහා අදාළ කාර්තුමය පිරිවැටුම රුපියල් මිලියන 500 සිට රුපියල් මිලියන 250 දක්වා අඩුවීම මෙන්ම මුළු සැපයුම් අගයෙන් 25% දක්වා එ.අ.බ. නිදහස් කිරීමේ වටිනාකම සීමාවීම සහ රේගුවේ දී ආනයන භාණ්ඩ කිහිපයක් මත එ.අ.බදු නිදහස් කිරීම ඉවත් කිරීම විය හැකිය.

ආදායම් බදු රැස්කිරීම මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2013 වසරේ 40.42% සිට 2014 වසරේ 37.33% පහළ බැස ඇති අතර එහි නාමික අගය පෙර වසරෙහි වූ රුපියල් මිලියන 122,020 සිට 2014 වසරේ රුපියල් මිලියන 121,260 දක්වා 3.57% කින් පහළ බැස ඇත. ආයෝජන සහ වාණිජ කටයුතු දිරිගැන්වීම සඳහා විවිධ ව්‍යවසායයන් සඳහා දැනටමත් ක්‍රියාත්මකව පවත්නා සහ අලුතෙන් හඳුන්වාදෙන ලද බදු දිරි දීමනා මෙම අඩුවීම කෙරෙහි හේතු කාරක විය හැකිය. කලින් වසර හා සසඳා බලන කළ, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බද්දෙන් ලද ආදායම සහ පොළිය මත රඳවාගැනීමේ බදු රැස්කිරීම පහළ බැස ඇති අතර, උ.වි.ගෙ. බද්ද සහ ලාභාංශ බද්ද 2014 වසර තුළ ඉහළ ගොස් ඇත. රඳවාගැනීමේ බද්දෙන් ලද ආදායම 2013 වසරේ රුපියල් මිලියන 77,679 සිට 2014 වසරේ රුපියල් මිලියන 62,402 දක්වා නාමික අගය 11.22% කින් පහළ ගොස් ඇත. 2014 වසරේ දේශීය වෙළෙඳපොළෙහි පොළී අනුපාතිකය පහළයාමත්, රජයේ සුරැකුම්පත් නිකුතුව අඩුවීමත් මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය.

අනුරූපී ඇස්තමේන්තු සමඟ එක් එක් බදු වර්ග රැස්කිරීම් හි අගයන් 02 වගුවෙහි දක්වා ඇති අතර, එය 01 වන සටහනින් නිරූපණය කෙරේ. වර්ෂය තුළ මුල්‍ය ප්‍රවාහය 03 වන වගුවෙහි දක්වා ඇති අතර එය 02 වන සටහනෙන් නිරූපණය කෙරේ.


**වගුව 02 - මුළු ආදායම රැස්කිරීම - 2014**

| බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව රු. (සංශෝධිත) | ආදායම් රැස්කිරීම රු. | රැස්කිරීම් ඇස්තමේන්තුවේ % ක් ලෙස | රැස්කිරීම් මුළු ආදායමේ % ක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 256,000,000,000 | 191,960,050,670 | 74.98% | 37.33% |
| ආර්ථික සේවා ගාස්තුව | 8,400,000,000 | 6,154,508,746 | 73.27% | 1.20% |
| හර බද්ද | - | - | - | |
| ඔට්ටු හා සූදු බද්ද | 1,500,000,000 | 815,175,141 | 54.35% | 0.16% |
| කොටස් ගනුදෙනු බද්ද | 2,200,000,000 | 2,048,048,604 | 93.09% | 0.40% |
| එකතු කළ අගය මත බද්ද | 290,000,000,000 | 237,915,432,907 | 82.04% | 46.27% |
| භාණ්ඩ හා සේවා බද්ද | - | 3,459,764 | - | 0.00% |
| පිරිවැටුම් බද්ද | 30,000,000 | 472,185,201 | 1573.95% | 0.09% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 13,772,420 | - | 0.00% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 1,000,000,000 | 841,828,584 | 84.18% | 0.16% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 45,600,000,000 | 65,353,982,522 | 143.32% | 12.71% |
| මුද්දර බද්ද | - | 7,918,141,767 | - | 1.54% |
| ඉඩම් බද්ද | 600,000,000 | 579,471,620 | 96.58% | 0.11% |
| සමාජ වගකීම් බද්ද | 40,000,000 | 84,655,276 | 47.25% | 0.02% |
| **මුළු ආදායම් රැස්කිරීම** | **605,370,000,000** | **514,160,713,222** | **84.93%** | **100.00%** |

* පළාත් සභාවලට මාරුකරන ලද ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම රු.20,770,860,807 කි.

** පළාත් සභාවලට මාරුකරන ලද මුද්දර බදු රැස්කිරීම රු.2,218,141,262 කි.


*** රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මාරුකරන ලද සමාජ ආරක්ෂන බදු රැස්කිරීම රුපියල් 84,655,226 කි.




## 2.3 මුළු ආදායම් ප්‍රවාහය

වගුව 03 - මුළු ආදායම් ප්‍රවාහය - 2014


| මාසය | ආදායම් රැස් කිරීම් (ස.ආ.බ. ඇතුළුව) රු. | සමුච්චිත ආදායම් රැස් කිරීම් රු. |
|---|---|---|
| ජනවාරි | 38,235,887,209.12 | 38,235,887,209.12 |
| පෙබරවාරි | 44,873,589,332.40 | 83,109,476,541.52 |
| මාර්තු | 34,617,564,908.51 | 117,727,041,450.03 |
| අප්‍රේල් | 42,007,850,601.47 | 159,734,892,051.50 |
| මැයි | 43,860,193,149.91 | 203,595,085,201.41 |
| ජූනි | 45,623,696,586.26 | 249,218,781,787.67 |
| ජූලි | 46,528,129,586.90 | 295,746,911,374.57 |
| අගෝස්තු | 47,389,362,121.50 | 343,136,273,496.07 |
| සැප්තැම්බර් | 46,801,508,410.39 | 389,937,781,906.46 |
| ඔක්තෝබර් | 43,591,791,521.19 | 433,529,573,427.65 |
| නොවැම්බර් | 43,231,526,754.82 | 476,761,100,182.47 |
| දෙසැම්බර් | 37,399,613,040.28 | **514,160,713,222.75** |



## 2.4 පෙර වසර සමඟ ආදායම සැසඳීම

| බදු වර්ගය | 2014 ආදායම් රැස් කිරීම් රු. | 2013 ආදායම් රැස් කිරීම් රු. | රැස් කිරීමේ අඩුවීම හෝ වැඩිවීම (%) ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බදු | 191,960,050,670 | 199,070,030,704 | -3.57% |
| ආර්ථික සේවා ගාස්තු | 6,154,508,746 | 6,595,600,863 | -6.69% |
| හර බද්ද | | (83,401) | -100.00% |
| ඔට්ටු හා සූදු බද්ද | 815,175,141 | 591,870,451 | 37.73% |
| කොටස් ගනුදෙනු බද්ද | 2,048,048,604 | 1,197,409,071 | 71.04% |
| එකතු කළ අගය මත බද්ද | 237,915,432,907 | 217,686,923,042 | 9.29% |
| භාණ්ඩ හා සේවා බද්ද | 3,459,764 | 15,976,746 | -78.35% |
| පිරිවැටුම් බද්ද | 472,185,201 | 218,080,060 | 116.52% |
| ජාතික ආරක්ෂක බද්ද | 13,772,420 | 2,149,612 | 540.69% |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 841,828,584 | 750,907,497 | 12.11% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 65,353,982,522 | 59,397,332,038 | 10.03% |
| මුද්දර බද්ද | 7,918,141,767 | 6,884,387,291 | 15.02% |
| ඉඩම් බද්ද | 579,471,620 | 96,741,230 | 498.99% |
| සමාජ වගකීම් බද්ද | 84,655,276 | 32,106,064 | 163.67% |
| **මුළු ආදායම් එකතුව** | **514,160,713,222** | **492,539,431,267** | **4.39%** |

සටහන 03
පෙර වර්ෂය සමඟ ආදායම සැසඳීම




## 2.5 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම් පළාත් සභාවලට මාරුකිරීම

2011 අයවැය යෝජනාවලට අනුකූලව පනවා ඇති අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට කරන ලද සංශෝධන ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් රැස්කරනු ලබන පහත සඳහන් බදු පළාත් සභාවලට මාරුකරන ලදි.

| | |
|---|---|
| ජාතිය ගොඩනැගීමේ බදු | 33.33% |
| මුද්දර බදු | 100% |

පළාත් සභාවලට මාරුකරන ලද මුදල සහ දෙපාර්තමේන්තුව විසින් අදාළ බදුවල මුළු රැස්කිරීම් ප්‍රමාණය 04 වන වගුවේ දැක්වේ.

| වගුව 04 - පළාත් සභාවලට බදු ආදායම් රැස්කිරීම - 2014 | | | |
|---|---|---|---|
| | මුළු එකතුව රු. | පළාත් සභාවලට මාරු කළ ප්‍රමාණය රු. | % |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 65,353,982,522.00 | 20,770,860,807.00 | 33.33% |
| මුද්දර බද්ද | 7,918,141,767.00 | 7,918,141,767.00 | 100% |

## 2.6 ආදායම් රැස්කිරීම් - ස්ව තක්සේරු පදනම සහ අනෙකුත් පදනම්

වසර තුළ රැස්කරන ලද සමස්ත ආදායමෙන් (ආනයන මත එකතු කළ අගය මත බදු හා ආනයන මත ජාතිය ගොඩනැගීමේ බදු හැර) ස්ව තක්සේරු පදනම යටතේ ගෙවීම් සමස්ත වටිනාකමට සම්පූර්ණයෙන්ම වාගේ දායකත්වය ලබාදුනි. තවද නිල තක්සේරු ආකාරයෙන් ආදායම් රැස්කිරීම මුළු එකතුවෙන් සියයට 4 ක් පමණි. ස්ව තක්සේරු පදනම යටතේ ආදායම් රැස්කිරීම සඳහා තම මෙහෙවරෙහි ප්‍රධාන කොටස ලෙස ස්වේච්ඡා බදු අනුකූලතාවය දිරිගැන්වීම පිණිස ගන්නා ලද ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය මෙයින් පිළිඹිබු වේ. මේ සම්බන්ධයෙන් ගන්නා ලද අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග සහ පහසුකම් මෙකී සාර්ථකත්වය සඳහා අඛණ්ඩව දායක විය. මේ පිළිබඳ සංසන්දනාත්මක අගයයන් 05 වැනි වගුවෙහි දක්වා ඇත.

| වගුව 05 - ස්ව තක්සේරු සහ වෙනත් පදනම් මත රැස්කිරීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2012 ( රු.'000 ) | | 2013 ( රු.'000 ) | | 2014 ( රු.'000 ) | |
| | ස්ව තක්සේරු | වෙනත් | ස්ව තක්සේරු | ස්ව තක්සේරු | වෙනත් | ස්ව තක්සේරු |
| ආදායම් බද්ද | 152,640,354 | 5,088,549 | 189,657,462 | 9,412,569 | 181,977,746 | 9,982,305 |
| එකතු කළ අගය මත බද්ද (ආනයන මත එ.අ.බ. හැර) | 101,816,629 | 3,370,532 | 117,622,485 | 3,474,351 | 129,744,521 | 5,890,227 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද (ආනයන මත ජා.ගො.බ. හැර) | 30,496,246 | 3,233,290 | 35,840,240 | 1,113,648 | 39,800,767 | 1,791,628 |
| වෙනත් | 23,485,987 | 479,049 | 15,849,578 | 535,568 | 143,486,800 | 1,486,719 |
| **එකතුව** | **308,439,216** | **12,171,420** | **358,969,765** | **14,536,136** | **495,009,834** | **19,150,879** |
| සමස්ත ආදායමට % (ආනයන මත එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද හැර) | 96% | 4% | 96% | 4% | 96% | 4% |


## 2.7 රජයේ ආදායමට දේශීය ආදායම් දායකත්වය

2014 වසරේ රජයේ ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය මෙන්ම පසුගිය වසර හතරක කාලය තුළ එහි ප්‍රවණතාවයන් 06 වන වගුවෙන් පෙන්වයි. මෙම දායකත්වයන් 04 වන සටහනින් නිරූපණය කෙරේ. 2014 වසරේ රජයේ ආදායම රුපියල් මිලියන 1,195,206 (මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව - 2014) දක්වා වැඩි වී ඇත්තේ මුළු රාජ්‍ය ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීම්වල දායකත්වය 43.02% ක් ලෙස වාර්තා කරමිනි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඛණ්ඩව පහළ ගොස් ඇති අතර, එය 2014 වසරේ දී 5.25% ක් ලෙස සටහන් වේ. මෑත කාලයේ දී බදු දීමනා, විරාම, නිදහස් කිරීම් සහ සහනදායී බදු අනුප්‍රමාණයන් හඳුන්වාදීම එම ප්‍රතිශතයන්හි අඩුවීම සඳහා හේතුව විය හැකිය.

| වගුව 06 - ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ රාජ්‍ය ආදායමට සහ දළ දේශීය නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | රජයේ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් රැස් කිරීම (රු. මිලියන) | රජයේ ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රැස්කිරීමේ ප්‍රතිශතය | ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් හි පවත්නා මිල ගණන් යටතේ දළ ජාතික නිෂ්පාදන (රු. මිලියන) | දළ ජාතික නිෂ්පාදනයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය |
| 2010 | 817,280 | 422,512 | 51.69% | 5,604,104 | 7.54% |
| 2011 | 967,862 | 443,830 | 45.86% | 6,544,009 | 6.78% |
| 2012 | 1,051,461 | 443,456 | 42.18% | 7,582,376 | 5.85% |
| 2013 | 1,137,447 | 492,539 | 43.30% | 8,674,230 | 5.68% |
| 2014 | 1,195,206 | 514,161 | 43.02% | 9,784,672 | 5.25% |

මූලාශ්‍රය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය (වාර්ෂික වාර්තාව) ශ්‍රී ලංකා මහ බැංකුව (වාර්ෂික වාර්තාව)




## 2.8 වාර්තා සැපයීමේ අනුකූලතාවය

ආදායම් වාර්තා නිසි වේලාවට සැපයීම මගින් සහ ස්ව තක්සේරු මත පදනම්ව බදු ගෙවීම සඳහා බදු ගෙවන්නන්ගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වර්ෂය පුරා ක්‍රියාත්මකව පැවතිණි. වරප්‍රසාද කාඩ්පත් ලබාදීම (රන් සහ රිදී කාඩ්පත්) මෝටර් රථ ආනයනය මත බදු සහන ප්‍රදානය කිරීම, කලින් ගෙවීම් කරන බදු සම්බන්ධයෙන් වට්ටම් ලබාදීම වැනි බදු නීතීන් කෙරෙහි ස්වේච්ඡා අනුකූලතාවය ඉහළ නැංවීම පිණිස තනිපුද්ගල බදු ගෙවන්නන් සඳහා ප්‍රතිලාභ ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී.

ඒ අනුව 2013/2014 වර්ෂය තුළ දී නියමිත දින සංස්ථාපිත නොවන අංශයේ ආදායම් බදු වාර්තා කිරීමේ ප්‍රතිශතය 42% ක් වූ අතර නියමිත දිනෙන් එක් මාසයක් තුළ එය 57% දක්වා ඉහළ ගොස් ඇත. නියමිත දිනෙන් මාස දෙකක් තුළ අනුකූලතා අනුප්‍රමාණය මෙම අංශයෙහි 65% ක් විය.

සංස්ථාපිත අංශය සම්බන්ධයෙන්, එය නියමිත දිනට 53% ක් වූ අතර, නියමිත දිනෙන් එක් මසක් තුළ එය 61% ක් විය. නියමිත දිනෙන් මාස දෙකක් තුළ අනුකූලතා අනුප්‍රමාණය මෙම අංශයෙහි 64% ක් විය.

07 වන වගුවෙන් 2002/2010 සිට 2013/2014 වසර දක්වා නියමිත දිනට සහ නියමිත දින සිට එක් මසක් තුළ ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය පෙන්වයි. අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතා අනුප්‍රමාණයන් 08 වන වගුවෙන් පෙන්වයි.

සියලු බදු වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය ස්ව තක්සේරු බදු ක්‍රමයක අපේක්ෂිත මට්ටම නොවුනද, බොහෝදුරට අනුකූල වී ඇත. කෙසේ වෙතත් අදාළ වර්ෂයේ දී එ.අ.බ. සහ ආ.සේ.ගා. වාර්තා සැපයීමේ අනුකූලතා අනුපාතය සැලකිය යුතු අඩුවීමක් දැකගත හැකිය. බද්දට යටත් පිරිවැටුමේ සීමාව ඉහළ දැමීම නිසා එම බදු වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බවට වරදවා වටහා ගැනීම මෙයට හේතුව විය හැකිය. කෙසේ වෙතත්, වාර්තා අනුකූලතාවය සාක්ෂාත් කර ගැනීමෙහි ලා දේ.ආ. දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග නොකඩවා සිදු කරනු ලබයි.

**වගුව 07 - ආදායම් බදු වාර්තා සැපයීමේ අනුකූලතාවය 2009/2010 සිට 2013/2014 දක්වා**

| තක්සේරු වර්ෂය | අංශය | නියමිත දිනට අනුකූලතාවය | නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාවය |
|---|---|---|---|
| 2009/2010 | සංස්ථාපිත | 52% | 66% |
| | සංස්ථාපිත නොවන | 41% | 53% |
| 2010/2011 | සංස්ථාපිත | 56% | 68% |
| | සංස්ථාපිත නොවන | 42% | 59% |
| 2011/2012 | සංස්ථාපිත | 56% | 60% |
| | සංස්ථාපිත නොවන | 39% | 48% |
| 2012/2013 | සංස්ථාපිත | 56% | 70% |
| | සංස්ථාපිත නොවන | 41% | 54% |
| 2013/2014 | සංස්ථාපිත | 53% | 61% |
| | සංස්ථාපිත නොවන | 42% | 57% |

| වගුව 08 - අනෙකුත් බදු සම්බන්ධයෙන් වාර්තා සැපයීමේ අනුකූලතාවය | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය | එකතු කළ අගය මත බදු | ආර්ථික සේවා ගාස්තු | ජාතිය ගොඩනැගීමේ බදු | උපයන විට ගෙවීමේ බදු | |
| වසර 2012 | 89% | 80% | 79% | තක්සේරු වර්ෂ 2011/12 | 52% |
| වසර 2013 | 78% | 93% | 77% | තක්සේරු වර්ෂ 2012/13 | 53% |
| වසර 2014 | 49% | 71% | 84% | තක්සේරු වර්ෂ 2013/14 | 55% |

## 2.9 ආදායම් බදු රැස්කිරීම

සංස්ථාපිත ආදායම් බදු, පුද්ගල ආදායම් බදු, ලාභාංශ බදු සහ රඳවාගැනීමේ බදු 2013 වසරේ රුපියල් මිලියන 199,070 ට සාපේක්ෂව 2014 වසරේ දී රුපියල් මිලියන 191,960 දක්වා 3.57% කින් පහළ ගියේය. වර්ෂයේ මුළු ආදායම් බදු රැස්කිරීම, දෙපාර්තමේන්තුවේ මුළු ආදායමෙන් 37.33% ක් වූ අතර එය 2013 වසරේ දී 40.42% ක් විය. යටිතල පහසුකම්, විදුලිබල උත්පාදනය සහ අපනයන යනාදිය ඇතුළුව විවිධ සේවාවන් දිරිගැන්වීම සඳහා මෑත අතීතය තුළ හඳුන්වාදෙන ලද බදු දිරි දීමනා, විරාම සහ සහනදායී අනුප්‍රමාණයන් ආදායම් බද්දෙන් ලද ආදායම අඩුවීම සඳහා හේතූන් විය හැකිය.

### 2.9.1 ආදායම් බදු රැස්කිරීම ආංශීය වශයෙන් පැහැදිලි කිරීම

මුළු ආදායම් බදු රැස්කිරීම සඳහා සංස්ථාපිත අංශයෙන් ලද දායකත්වය රුපියල් මිලියන 22,028 ක් හෙවත් එකතු කරන ලද මුළු බදු ප්‍රමාණයෙන් 48% ක් (රුපියල් මිලියන 191,960 ක්) විය. සංස්ථාපිත නොවන අංශයේ දායකත්වය රුපියල් මිලියන 99,931 ක් හෙවත් 52% කි.


අංක 9 වගුව මගින් එහි සංයුතිය පෙන්වන අතර 05 වන සටහනෙන් එය නිරූපණය කෙරේ.

| වගුව 09 - සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම් 2013 සහ 2014 | | | | |
|---|---|---|---|---|
| | 2014 | | 2013 | |
| | බදු රැස් කිරීම (රු.) | % | බදු රැස් කිරීම (රු.) | % |
| සංස්ථාපිත* | 92,028,323,420.00 | 48% | 94,053,497,550.00 | 47% |
| සංස්ථාපිත නොවන** | 99,931,727,250.00 | 52% | 105,016,533,154.00 | 53% |
| **එකතුව** | **191,960,050,670.00** | **100%** | **199,070,030,704.00** | **100%** |

* 2013 වසරේ රු. මිලියන 9,767 ක සහ 2014 වසරේ රු. මිලියන 10,365 ක ලාභාංශ බදු ඇතුළත්ය.

** පොළී ආදායමෙන් සංස්ථාපිත අංශය විසින් ඉටු කරන ලද සේවාවන්ගෙන් අඩු කරන ලදුව, ප්‍රේෂණය කරන ලද උපයන විට ගෙවීමේ (PAYE) ක්‍රමය යටතේ සේවා නියුක්තීන් විසින් ගෙවන ලද ආදායම් ඇතුළත් ය.

**සටහන 05**
**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු රැස්කිරීම්**
**2013 සහ 2014**



### 2.9.2 ආදායම් බදු රැස්කිරීමේ ප්‍රභවමය වශයෙන් විශ්ලේෂණය

වසර තුළ රැස්කරන ලද ආදායම් බදුවල ප්‍රභවමය වශයෙන් සංයුතිය (සේවා නියුක්ත සහ වෙනත්) අංක 10 දරන වගුවෙන් දැක්වේ.

| වගුව 10 - ආදායම් බදු රැස්කිරීම - 2014 | | |
|---|---|---|
| ප්‍රභවය | බදු රැස් කිරීම (රු. මිලියන) | |
| **සේවා නියුක්තිය** | | |
| උ.වි.ගෙ. ක්‍රමය | 21,957.17 | |
| පැහැර හරින ලද බදු සමඟ දණ්ඩන තක්සේරු කිරීම් | 353.44 | **22,310.61** |
| **වෙනත්** | | |
| ස්ව තක්සේරු සහ දණ්ඩන සමඟ තක්සේරු කිරීම් | 89,724.71 | |
| පොළී මත රඳවාගැනීමේ බදු, වාර්ෂික ගෙවීම් මත අඩු කිරීම්, රාජ්‍ය භාග හෝ කළමනාකරණ ගාස්තු | 69,627.10 | |
| ප්‍රභවයේ දී අඩු කිරීම් | 10,384.56 | |
| **දළ බදු රැස් කිරීම** | | **192,046.98** |
| අඩු කළා: ආපසු ගෙවීම් | | -86.93 |
| **ශුද්ධ රැස් කිරීම්** | | **191,960.05** |

රඳවාගැනීමේ බදු යාන්ත්‍රණය යටතට නොගැනෙන වෙළෙඳාම, ව්‍යාපාර, වෘත්තීය, රැකියාව සහ වෙනත් සේවා මත බදු ඇතුළුව ස්ව තක්සේරු හා දණ්ඩන සමඟ තක්සේරු ආකාරයෙන් රැස්කිරීම් රු. 82,224/- කි.

### 2.9.3 ආදායම් බද්දට අදාළව ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

සමාලෝචනයට බඳුන් කරන වර්ෂය තුළ අයවැය මගින් ප්‍රකාශිත පරිදි බදුකරණ යෝජනා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස දේශීය ආදායම් පනතට පහත සඳහන් වෙනස් කිරීම් සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

**බදු නිදහස් කිරීම්**

පහත සඳහන් ආයතනයන්හි යම් ලාභ සහ ආදායම (ලාභාංශ හා පොළී හැර) ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.

- 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනත යටතේ පිහිටුවන ලද ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවි ආයතන පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා අලෙවි ආයතනය
- 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතන පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය

පහත සඳහන් ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදි.

(අ) කිසියම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක නිරත නොවන සේවා නියුක්තිකයකුගේ, කිසියම් තක්සේරු වර්ෂයක් තුළ යම් සේවා නියුක්තියකින් ආදායම, හෝ ප්‍රභවයේදී අවසාන බද්දක් වන වෙනත් ලාභ හා ආදායමක් නොවන්නා වූ රුපියල් 48,000/- ක ආදායම්, ඒ තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්ති ආදායමෙන් බදු අඩු කොට ඇත්නම්,

(ආ) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමට හෝ සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමට, එම සමාගමේ විශේෂ අවශ්‍යතාවයන් අනුව පරිගණක මෘදුකාංග පාවිච්චිය සඳහා ලබාදීම මත ශ්‍රී ලංකාවෙන් පිටත යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට කරනු ලබන ගෙවීමකට අදාළව ලැබෙන හෝ උපචිත වන ලාභ සහ ආදායම් මත එම රටෙහි දී ගෙවිය යුතු බද්ද සඳහා සහනයක්, ශ්‍රී ලංකාව හා එම රට අතර බලාත්මක වන ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා වන ගිවිසුමක් නොපැවැත්වීම මත නොලැබෙන්නේ නම් හෝ එම අනෙක් රටෙහි එම සේවා සැපයීම වෙනුවෙන් බද්දක් ගෙවීමට නොමැති නම්,

(ඇ) සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත කරන ලද ආයෝජනයක් මත ලැබෙන, දේශීය

ආදායම් පනතේ 10 (1) ඒ වගන්තියේ සඳහන් නිදහස් ලාභාංශයක, එම ලාභාංශය ලැබී මාසයක් ඇතුළත බෙදා හරින්නේ නම්,

**සහනදායී අනුප්‍රමාණයන්**

i. ඇඟලුම් අපනයනකරුවන්ට සපයනු ලබන විවිධ සේවාවන්ගෙන් ලැබෙන ලාභ සහ ආදායම් මත දැනට අදාළ වන සහනදායී බදු අනුප්‍රමාණය වූ සියයට 12,

- භාණ්ඩ හා සේවා අපනයන කරුවන්ට හෝ
- සෘජුවම විදේශ ප්‍රධානියාට

සපයන විට සහ අදාළ අපනයන භාණ්ඩයේ ඉඳුරාම අවශ්‍ය වන සේවයක් වන කොටසක් ලෙස හෝ අපනයනය සඳහා අත්‍යවශ්‍ය සේවාවක් වන්නා වූ විට, සහ අදාළ අපනයනකරු විසින් හෝ අදාළ විදේශීය ගැණුම්කරු විසින් ශ්‍රී ලංකාවේ අදාළ සේවා සැපයුම්කරුට, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදුකරන විට, සැපයුම්කරුට, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදුකරන විට, එම සැපයුම්කරුවන්ට ද දීර්ඝ කෙරේ.

ii. රුපියල් මිලියන 500 නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත ව්‍යවසායන් සඳහා අදාළ අනුප්‍රමාණය 12% දක්වා ප්‍රතිශෝධනය කරන ලදි.

iii. වෘත්තිකයන් සඳහා බදු අනුප්‍රමාණ පහත සඳහන් පරිදි අඩුකරන ලදි.

| වෘත්තියෙන් උපයන ආදායම | උපරිම බදු අනුප්‍රමාණය |
|---|---|
| රු.මි. 25 නොඉක්මවන | 12% |
| රු.මි. 25 ඉක්මවන නමුත් රු.මි. 35 නොඉක්මවන | 14% |
| රු.මි. 35 ඉක්මවන | 16% |

iv. වෘත්තිකයන්ගේ සේවානියුක්ත ආදායම මත අදාළ උපරිම ආදායම් බදු අනුප්‍රමාණය සියයට 16 දක්වා අඩු කරන ලදි.

v. රුපියල් මිලියන 5 නොඉක්මවන බදු අය වන ආදායම සහිත සමාගම් සඳහා අදාළ අවම බදු අනුප්‍රමාණය ඉවත්කරන ලදි.

vi. දේශීය ආදායම් පනතේ 59 ඇ වගන්තියේ සඳහන් පරිදි අදාළ අනුප්‍රමාණයෙන් අර්ධයක් අදාළ කර ගැනීමෙහි ලා පොදු මහජනතාවට 20% කට වඩා අඩුවෙන් නිකුත් කර ඇති ලැයිස්තුගත සමාගමක කොටස් සඳහා කාලසීමාව, එම සමාගම් ලාභ මත සංස්ථාපිත ආදායම 28% ක් හෝ ඊට වැඩියෙන් ගෙවන්නේ නම් තවදුරටත් වර්ෂ තුනක කාලපරිච්ඡේදයක් සඳහා දීර්ඝ කරන ලදි.

**සේවා නියුක්තියෙන් ලැබෙන පාරිශ්‍රමික වලින් අඩු කිරීම**

i. එක් සේවා යෝජකයකුට වඩා වැඩි සේවා යෝජකයන් යටතේ සේවය කරන විට 10% බදු අනුපාතය අදාළ කර ගැනීමේ සීමාව සේවානියුක්ත වන පුද්ගලයකු සම්බන්ධයෙන් රු. 50,000/- දක්වා වැඩි කෙරේ.

ii. එක් සේවා යෝජකයෙකුට වඩා වැඩි සේවායෝජකයින් යටතේ සේවය කිරීමෙන් හෝ වෙනස් සේවා ස්ථානවල සේවය කිරීමෙන් පුද්ගලික පාවිච්චිය සඳහා මෝටර් රථයක් ලබාදීමේ හෝ දීමනාවක් ලබාදීමේ ප්‍රතිලාභය එක් සේවා යෝජකයෙකුට වඩා වැඩි සේවා යෝජකයන්ගෙන් ලැබේ නම්, රු. 50,000/- කට වඩා වැඩි වන ප්‍රතිලාභය හෝ දීමනාව එම සේවා නියුක්තිකයාගෙන් බද්දට යටත් ආදායමේ කොටසක් වේ.

**බදු විරාම සහ සුදුසුකම් ලැබීමේ දීමනාවලට අදාළ සීමා කිරීම**

i. දේශීය ආදායම් පනතේ 22 වන වගන්තිය යටතේ බදු නිදහස් කිරීම 2014.04.01 දිනට පෙර කරනු ලැබුවා වූ ආයෝජනවලට සීමා කරන ලදි.

ii. 34 වගන්තියේ (2) වන උපවගන්තියේ (ණ) සහ (ත) ඡේදයේ සඳහන් දැනට පවත්නා ව්‍යවසායයන් සඳහා ව්‍යාපාර පුළුල් කිරීම යටතේ කර ඇති ආයෝජනය වෙනුවෙන් සුදුසුකම් ලබන දීමනා අඩු කිරීම 2014.04.01 දිනට පෙර කරන ලද ආයෝජනයන් සඳහා සීමා කරන ලදි.

iii. පර්යේෂණ හා සංවර්ධන, එළිදැක්වීමේ වියදම් අඩු කිරීම ද ඇතුළුව විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ අඩු බදු අනුපාතිකයන් කඩිනම් ක්ෂය කිරීමේ දීමනා ලබාදීම සැලකිල්ලට ගෙන දැනට පවතින අවම ආයෝජන ප්‍රමාණය හා අනුරූප වූ බදු විරාම කාලය තවදුරටත් සාධාරණීකරනය කරන ලදි. (දේශීය ආදායම් පනතේ 16 ඇ, 16 ඈ සහ 17 අ වගන්ති සංශෝධනය කරන ලදි.)

**වෘත්තීය සේවා අංශය සඳහා විශේෂ බදු සහන**

**ජාත්‍යන්තර මූලස්ථාන සහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල ප්‍රතිස්ථානගත කිරීම**

ජාත්‍යන්තර ජාලයේ පවතින ජාත්‍යන්තර මූලස්ථාන හෝ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල ශ්‍රී ලංකාවේ

ප්‍රතිස්ථානගත කිරීම දිරිගැන්වීම සඳහා පහත සඳහන් සහන ප්‍රදානය කරන ලදි.

(අ) විශේෂ කාලපරිච්ඡේදයක් සඳහා විශේෂ ආදායම් බදු විරාම.

(ආ) එවැනි මූලස්ථාන හෝ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල සංස්ථාගත කිරීමට අදාළ විශේෂ සහන

(ඇ) විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් සම්බන්ධයෙන් එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) ගෙවීම සඳහා සහන

**වෘත්තිකයන් සඳහා බද්ධ නිවාස සංකීර්ණ (Residential Apartments) ඉදි කිරීම.**

යම්කිසි පුද්ගලයෙක් තනිවම හෝ වෙනත් අය සමඟ වෘත්තියක නියැලෙමින් සිටිමින්, බැංකුව හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සමඟ ඔවුන්ගේ වාසික කටයුත්ත සඳහා බද්ධ නිවාස සංකීර්ණයක් ඉදි කිරීමේ කටයුත්තක් සඳහා සහවාසයක් (Consortium) ස්ථාපිත කරන්නේ නම් පහත සඳහන් සහන ලබාදෙන ලදි.

(අ) එම කාර්ය සඳහා එම පුද්ගලයින්ට දෙනු ලබන බැංකු ණය පහසුකම් මත අදාළ වන පොළිය මත ගෙවිය යුතු බද්ද අඩක් විය.

(ආ) ණය ප්‍රාග්ධනය ආපසු ගෙවීම මත මසකට රු.50,000/- නොඉක්මවන වටිනාකමින් යුතු සුදුසුකම් ලබන ගෙවීම, අදළ ගෙවීම් මත එම තැනැත්තන්ගෙන් මුළුමනින්ම අඩු කිරීම සඳහා ඉඩ දෙන ලදි.

(ඇ) දේපළ පැවරීමේ ඔප්පු මත අදාළ මුද්දර ගාස්තු සියයට 25 කින් අඩු කරන ලදි.

**ජාත්‍යන්තරව සන්නම් නාම සහිතව ස්ථාපනය කරන ලද බුද්ධිමය දේපළ අත්පත් කරගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා දෙනු ලබන සහන**

යම් අන්තර් ජාතික වශයෙන් පිළිගත් බුද්ධිමය දේපළ අත්පත් කරගන්නා වූ සහ රාජ්‍ය භාග ආකාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් වලින් ආදායම් උපයන්නා වූ යම් ආයතනයකට පහත සඳහන් සහන පිරිනමන ලදි.

(අ) මුළු අත්පත් කරගැනීමේ පිරිවැය ආදායම් බදු කාර්යයන් සඳහා අඩු කිරීමට ඉඩදෙන ලදි.

(ආ) නියමිත කාලපරිච්ඡේදයක් සඳහා විදේශ විනිමය ඉපයීමෙන් ලද ආදායම නිදහස් කරන ලදි.

**වෘත්තිකයින් විසින් සාංගමික අස්ථිතියක් ඇති කිරීම සඳහා ලබාදෙන සහන**

ජාත්‍යන්තර සේවාවන් සැපයීම සඳහා පිහිටුවනු

ලබන සාංගමික අස්ථිතියක් සඳහා පහත සඳහන් සහන පිරිනමන ලදි.

(අ) බද්දට යටත් සේවාවන් සඳහා අවුරුදු 5 කට අදාළ වන සාංගමික බද්ද අඩක් වේ.

(ආ) වසරකට ඇ.ඩො. 100,000/- ඉක්මවන විදේශ විනිමය එකිනෙකට වෙනස් එක ළඟ අවුරුදු 3 ක් තුළ දී ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන්නේ නම්, මෝටර් රථයක් ආනයනය කිරීමේ දී ගෙවිය යුතු සමුච්චිත බදු හා තීරු බදු වලින් 10% ක් අඩු කිරීම සඳහා ඉඩ දෙන ලදි.

**නාවික කර්මාන්තයේ කුසලතා සංවර්ධනය සඳහා ලබාදෙන සහන**

අභ්‍යාසලාභීන් (trainees) ගේ කුසලතා වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය වන සේවාවන් සැලසීම සැලකිල්ලට ගනිමින් නැව් මෙහෙයවන්නන් හෝ කිසියම් විදේශ නාවික ඒජන්තවරයෙක් විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන් 10% ක් අඩු කිරීම සඳහා ඉඩ දෙන ලදි. පුහුණු කරනු ලැබූ පුහුණුවන්නන් සංඛ්‍යාව අනුව අඩු කිරීම සඳහා දෙනු ලබන මිණුම් දණ්ඩ තීරණය කරනු ලැබේ.

**මූල්‍ය සමාගමක් වන ප්‍රධාන සමාගමක් විසින් ඒකාබද්ධ කිරීමෙන් හෝ අත්පත් කර ගැනීමෙන් මූල්‍ය ආයතනයක් අත්පත් කරගැනීමේ පිරිවැය අඩු කිරීම.**

ප්‍රධාන සමාගමක් විසින් මූල්‍ය සමාගම් අත්පත් කරගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය සඳහා තක්සේරු වර්ෂ තුනක් තුළ අඩු කිරීමට ඉඩ දෙන ලදි.

## 2.10 එකතු කළ අගය මත බදු රැස්කිරීම.


අදාළ වර්ෂය තුළ දී එකතු කළ අගය මත බදු (VAT) රැස්කිරීම රුපියල් මිලියන 237,915 ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුගත රුපියල් මිලියන 290,000 ට වඩා රුපියල් මිලියන 52,085 ක අඩුවීමක් පෙන්වයි. කෙසේ වෙතත්, මෙම අගය කලින් වසරට වඩා රුපියල් මිලියන 20,229 ක හෙවත් 9.29% ක වැඩිවීමකි. දේශීය සැපයුම් සහ ආනයන මත රැස්කරන ලද එ.අ.බ. කොටස පෙර වසරට වඩා වැඩිවීමක් පෙන්වයි. වසර සඳහා රැස්කරන ලද මුළු දේශීය එ.අ.බදු රුපියල් මිලියන 135,635 ක් වූ අතර මෙම අගය 2013 වසරට වඩා රු. මිලියන 14,538 ක වැඩිවීමකි. එය රුපියල් මිලියන 121,097 ක් විය. 2014 වසර තුළ ආනයන

මත රැස්කරන ලද මුළු එ.අ.බ. රුපියල් මිලියන 102,280 ක් වූ අතර එය 2013 වසරේ රු. මිලියන 96,590 ක් විය.

එකතු කළ අගය මත ආංශික වශයෙන් දළ රැස්කිරීම, ආපසු ගෙවීම සහ ශුද්ධ රැස්කිරීම 11 වන වගුවෙන් පෙන්වන අතර, රැස්කිරීම් 06 වන සටහනෙන් නිරූපණය කෙරේ.

**වගුව 11- එකතු කළ අගය මත බදු දළ රැස් කිරීම් සහ ආපසු ගෙවීම්**

| අංශය | 2013 | | 2014 | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | | දළ රැස් කිරීම් (රු. මිලියන) | | | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | |
| **නිෂ්පාදන අංශය** | | 43,718.74 | | 46,174.34 | 732.64 | | 45,441.70 |
| **නිෂ්පාදන නොවන අංශය** | | | | | | | |
| - සේවාව | 56,149.83 | | 66,131.91 | | 379.24 | 65,752.67 | |
| - මූල්‍ය සේවාව | 21,203.51 | | 24,436.86 | | | 24,436.89 | |
| - වෛකල්පිත එ.අ.බ. | 24.76 | 77,378.10 | 3.49 | 90,572.26 | | 3.49 | 90,193.05 |
| **ආනයන** | | 96,590.08 | | 102,281.48 | 0.80 | | 102,280.68 |
| **එකතුව** | | **217,686.92** | | **239,028.08** | **1,112.68** | | **237,915.43** |




එකතු කළ අගය මත බදු රැස්කිරීමේ ආංශික වර්ගීකරණය සහ දළ ජාතික නිෂ්පාදනයට දායකත්වය 12 වන වගුවෙන් පෙන්වයි.

**වගුව 12 - දළ ජාතික නිෂ්පාදනයට එකතු කළ අගය මත බදු දායකත්වය ආංශික විශ්ලේෂණය**

| අංශය | 2013 | | 2014 | | දළ දේශීය නිෂ්පාදනයට එ.අ.බ. ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | % | ශුද්ධ රැස් කිරීම් (රු. මිලියන) | % | **2013** | **2014** |
| නිෂ්පාදන අංශය | 43,718,740,385 | 20.08% | 45,441,698,904 | 19.10% | 0.50% | 0.46% |
| නිෂ්පාදන නොවන අංශය | 77,378,096,221 | 35.55% | 90,193,048,803 | 37.91% | 0.89% | 0.92% |
| ආනයන මත | 96,590,086,435 | 44.37% | 102,280,685,200 | 42.99% | 1.11% | 1.05% |
| එකතුව | **217,686,923,041** | **100.00%** | **237,915,432,907** | **100.00%** | **2.50%** | **2.43%** |

## 2.10.1 එකතු කළ අගය මත බදු කර්මාන්තය අනුව ව්‍යාප්තිය

13 වන වගුව මගින් බැංකු, රක්ෂණ, හෝටල් සහ ආපනශාලා, ඉදිකිරීම්, විදුලිය යනාදී වශයෙන් වර්ගීකරණය කරන ලද දේශීයව එකතු කළ අගය මත සමස්ත ආදායමට ලබා දී ඇති දායකත්වය පෙන්වයි.

| වගුව 13:- දළ දේශීය එකතු කළ අගය මත බද්ද - නිෂ්පාදන සහ සේවා | | | | | |
|---|---|---|---|---|---|
| අංශය | 2012 (රු. මිලියන) | 2013 (රු. මිලියන) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) | 2014 (රු. මිලියන) | පසුගිය වසරට සාපේක්ෂව අඩුවීමේ/වැඩිවීමේ ප්‍රතිශතය (%) |
| බැංකු | 14,380 | 15,921 | 10.72% | 18,822 | 18.22% |
| රක්ෂණ | 4,456 | 4,882 | 9.56% | 4,910 | 0.57% |
| හෝටල් සහ ආපනශාලා | 5,396 | 5,672 | 5.11% | 6,507 | 14.72% |
| ඉදිකිරීම් | 5,871 | 5,293 | -9.85% | 6,943 | 31.17% |
| විදුලිය සහ ගෑස් | 570 | 502 | -11.93% | 560 | 11.55% |
| ආනයන | 6,949 | 9,113 | 31.14% | 10,389 | 14.00% |
| මූල්‍ය | 10,576 | 11,860 | 12.14% | 13,982 | 17.89% |
| සංනිවේදන | 211 | 256 | 21.33% | 394 | 53.91% |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 269 | 344 | 27.88% | 1,509 | 338.66% |
| පාන වර්ග - මද්‍යසාර | 9,043 | 9,747 | 7.79% | 9,930 | 1.88% |
| වර්ගීකරණය නොකළ සේවා | 7,633 | 7,916 | 3.71% | 9,866 | 24.63% |
| වර්ගීකරණය නොකළ නිෂ්පාදන | 7,105 | 9,517 | 33.95% | 10,280 | 8.02% |
| වෙනත් | 32,723 | 39,516 | 20.76% | 42,408 | 7.32% |
| **එකතුව** | **105,187** | **120,538** | **14.59%** | **36,500** | **13.24%** |

### 2.10.2 එකතු කළ අගය මත බදු වලට අදාළ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්

අදාළ වර්ෂය තුළ එකතු කළ අගය මත බදු පනත සඳහා පහත සඳහන් නිදහස් කිරීම් හඳුන්වා දෙන ලදි.

**නිදහස් කිරීම්**

i විදුලි සංදේශ සේවා සඳහා භාවිත කරන කිසියම් යන්ත්‍ර හෝ උසස් තාක්ෂණික උපකරණ දේශීය වශයෙන් මිලදී ගැනීම හෝ ආනයනය කිරීම මත දැනට විදුලි සංදේශ කර්මාන්තය සඳහා පවත්නා නිදහස් කිරීම්, දේශීය වශයෙන් මිලදී ගන්නා හෝ ආනයනය කරනු ලබන කම්බි, එම තඹ කම්බි විදුලි සංදේශ කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පාවිච්චි කරන්නේ නම්, එකතු කළ අගය මත බදු පනතේ පළමුවන උපලේඛනයේ දෙවන කොටසේ (අ) පරිච්ඡේදයේ (xx) අයිතමය යටතේ විශේෂයෙන් සඳහන් වූ කොන්දේසිවලට යටත්ව, නිදහස් කරනු ලැබේ. ආනයනය සඳහා නිදහස් කිරීම ලැබෙනුයේ එම කම්බි අදාළ ප්‍රමාණයට හා අදාළ තත්ත්වයට අනුව ශ්‍රී ලංකාව තුළ දී ලබාගත නොහැකි නම් පමණි.

ii මහජනතාවට සේවා සැපයීමට භාවිත කරන බවට අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරන ලද යම් පළාත් පාලන ආයතනයක් විසින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගලී බවුසර්, මාර්ග ට්‍රැක්ටර් සඳහා යොදාගන්නා අර්ධ ට්‍රේලර්, යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරීමේ දී දැනට ලබාදෙන අදාළ නිදහස් කිරීම් නියමිත කොන්දේසිවලට යටත්ව ලංකාවේ නිෂ්පාදකයෙකුගෙන් මිල දී ගන්නා විට අදාළ වන පරිදි දීර්ඝ කරන ලදි.

iii පහත සඳහන් භාණ්ඩ ආනයනයේ දී හෝ සැපයීමේ දී එකතු කළ අගය මත (VAT) බද්දෙන් නිදහස් කරන ලදි.

(අ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 62.15.10, 62.15.20, 62.15.90 යටතේ ටයිපටි හා බෝ (ටයි පටි)

(ආ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 96.08.30 යටතේ උසස් තත්ත්වයෙන් යුත් පෑන් (PEN)

(ඇ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0511.91.90, 9507.10, 9507.20, 9507.30 සහ 9507.90 යටතේ වන ශීත කළ මාළු ඇම, බිලී පිති, බිලී කොකු, මාළු බාන රෝද.

(ඈ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8402.21, 8402.22 යටතේ වන නාවික ධාවන එන්ජින්

**නිදහස් කිරීම් සීමා කිරීම**

i විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද (SCL) ට යටත් භාණ්ඩ මත එ.අ. බද්දෙන් නිදහස අදාළ කරගැනීම, ළිත් වර්ෂයක පැවති යම් මාස තුනක කාලපරිච්ඡේදයක් සඳහා රු. මිලියන 250 ඉක්මවන ආනයනය කරන ලද භාණ්ඩ වලින් දේශීය වෙළෙඳපොළේ සැපයුම් වටිනාකම මත යම් ආනයනකරුවෙකු සම්බන්ධයෙන් වන විට රේගුවේ දී ගෙවිය යුතු එ.අ. බද්දට පමණක් සීමා

කරන ලදි. ඒ අනුව, පළමු උපලේඛනයේ දෙවන කොටසේ (ආ) ඡේදයේ (xiii) අයිතමය යටතේ සඳහන් වන දේශීය භාණ්ඩ සැපයුම කවර වූ හෝ ලිත් වර්ෂයක යම් මාස තුනක කාලයක් සඳහා රු. මිලියන 250 ඉක්මවන්නේ නම් එකතු කළ අගය මත බද්ද සඳහා යටත් කරන ලදි.

ii පහත සඳහන් භාණ්ඩ ආනයනය හෝ අපනයන කොට සැපයුම් කරන ලද සැපයුම් මත නිදහස් කිරීම ඉවත් කරන ලදි.

(අ) අමු තේ දළු, හාල් පිටි, තිරිඟු පිටි, පාන්, බිත්තර, දියර කිරි හෝ කිරි පිටි ඇතුළුව, වී, සහල්, තිරිඟු, කරදමුංගු, කුරුඳු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ගම්මිරිස්, කපාපු පොල්, රබර්, රබර් කිරි, අමු පොල්, තේ.

(ආ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8701.10.10, 8701.10.90, 8701.20.10, 8701.90.10, 8701.90.20 යටතේ කෘෂිකාර්මික ට්‍රේලර් හෝ අර්ධ ට්‍රේලර් සඳහා වූ මාර්ග ට්‍රැක්ටර්.

(ඇ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 8438.80.40, 8422.10 යටතේ වන තේ හා රබර් කර්මාන්තය සඳහා යන්ත්‍ර සහ උපකරණ.

(ඈ) කර්මාන්ත හිමිකරුවන් විසින් නවීකරණය කරනු ලබන කර්මාන්තශාලා සඳහා වූ යන්ත්‍ර.

(ඉ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 24 (ඇ) වගන්තිය යටතේ බදු විරාම ලැබීමට සුදුසුකම් ලත් ව්‍යවසායන් සඳහා පිරියත හා යන්ත්‍රෝපකරණ.

(ඊ) සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 3003.20.11, 3003.20.12, 3003.20.13, 3003.20.15, 3003.20.12, 3004.20.11, 3004.20.12, 3004.20.13, 3004.20.15 හෝ 3004.20.12 යටතේ වූ ඖෂධ සැකසුම්.

**තොග සහ සිල්ලර වෙළෙඳාම සඳහා එකතු කළ අගය මත බදු**

i එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා තොග සහ සිල්ලර වෙළෙඳාමට අදාළව කාර්තුවක් සඳහා සැපයුමෙහි වටිනාකමෙහි නිදහස් සීමාව රු. මිලියන 500 සිට රු. මිලියන 250 දක්වා අඩු කරන ලදි. තොග සහ සිල්ලර වෙළෙඳාමේ නිරත සමූහ සමාගමක පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් කාර්තුවකට අදාළ බදු සීමාවට ළඟා වී ද යන්න තීරණය කරනු ලැබුයේ එම සමූහ සමාගමේ එක් එක්පාලිත සමාගම්වල හෝ ආශ්‍රිත සමාගම්වල එවැනි වෙළෙඳාමක නිරතවීමෙන් ලැබූ සමුච්චිත සැපයුම් වටිනාකම පදනම් කර ගනිමිනි.

ii පළමු උපලේඛනයේ II කොටසෙහි නියමිත භාණ්ඩ සැපයුමට අදාළ නිදහස් කිරීම එකතු කළ අගය මත බද්දට යටත් වන සැපයුමක් හා නිදහස් සැපයුමක් තොග හා සිල්ලර වෙළෙඳාම සම්බන්ධයෙන් වන විට, මුළු සැපයුමෙන් සියයට 25 උපරිමයකට යටත් වේ. එම යටත් සැපයුම මත ආරෝපිත යෙදවුම් බදු බැර (වේ නම්) මෙම ගැලපීමට අනුව එකතු කළ අගය මත බදු පනතේ 22 වන වගන්තියේ සඳහන් පරිදි ඉඩ දෙන ලදි.

**ජාත්‍යන්තර ගමනාගමනයෙහි අර්ථනිරූපණය විස්තීර්ණය කිරීම.**

ශ්‍රී ලංකාව තුළ ඇති ගුවන් තොටුපොළවල් අතර භාණ්ඩ හා මගී ප්‍රවාහනයට සෘජුවම අදාළ වන සේවාවන් ආවරණය කිරීම සඳහා දැනට ජාත්‍යන්තර ගමනාගමනය සඳහා වන අර්ථනිරූපණය විස්තීර්ණ කරන ලදි.

**එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම සඳහා දායකත්වය**

සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය හඳුන්වාදීම නිසා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් සඳහා ඉල්ලීම් අඩුවීම සැලකිල්ලට ගෙන රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ මත එකතු කළ අගය මත බදුවලින් ආපසු ගෙවීම් අරමුදලට දායකවන අනුපාතය සියයට 10 සිට සියයට 6 දක්වා අඩු කරන ලදි.


## 2.11 ජාතිය ගොඩනැගීමේ බදු (NBT) රැස්කිරීම

අදාළ වර්ෂය තුළ මුළු ආදායමට ලබාදෙන ලද ජා.ගො. බදු දායකත්වය රු. මිලියන 65,357 ක් විය. 2013 වසරේ වූ රු. මිලියන 59,397 හා සසඳා බලන කළ මෙය 10.03% ක අතිරික්තයකි. බැංකු සහ මූල්‍ය සේවා සඳහා ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් ඉවත් කිරීමෙන් බදු පදනම පුළුල් කිරීම හේතුකොටගෙන සේවා මත ජා.ගො.බ. වලින් උත්පාදනය කරන ලද ආදායම රු. මිලියන 17,600 දක්වා 28.48% කින් ඉහළ ගියේය. මුළු ජා.ගො.බදු ආදායමෙන් රු. මිලියන 20. 77 ක අගයක් පළාත් සභා වෙත මාරුකරන ලදි.

**වගුව 14 - ආංශික වශයෙන් ජා.ගො.බදු රැස්කිරීම - 2014**

| අංශය | ශුද්ධ රැස් කිරීම (රු.) | |
|---|---|---|
| | 2013 | 2014 |
| නිෂ්පාදන | 16,418,159,594 | 15,354,329,424 |
| සේවා | 20,535,728,568 | 26,238,065,267 |
| ආනයන | 22,443,443,876 | 23,764,587,831 |
| **එකතුව** | **59,397,332,038** | **65,356,982,522** |

| වගුව 15 - ඇස්තමේන්තු සමඟ ජාතිය ගොඩනැගීමේ බදු රැස් කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම් රැස්කිරීම (රු.) | % |
| 2014 | 45,600,000,000 | 44,583,121,715 | 98% |
| 2013 | 48,782,000,000 | 40,936,670,691 | 84% |



සටහන 07
ජාතිය ගොඩනැගීමේ බදු රැස්කිරීම
2014

### 2.11.1 ජාතිය ගොඩනැගීමේ බද්දට අදාළව සිදුකරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම්:

අයවැය මගින් යෝජිත පරිදි ජා.ගො.බ. (NBT) පනතට පහත සඳහන් වෙනස්කම් සිදුකරන ලදි.

**බදු නිදහස් කිරීම්**

i. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා බදු රහිත වෙළෙඳසැල් වලින් කරනු ලබන සිල්ලර භාණ්ඩ වෙළෙඳාම.

ii. නිෂ්පාදකයා විසින් දේශීයව නිෂ්පාදනය කරන ලද පොල්තෙල් විකිණීම වර්ෂ තුනක කාලයක් සඳහා

iii. L P ගෑස් බෙදාහැරීම

iv. විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා ගුවන් තොටුපොළක කරනු ලබන සේවා සැපයුම.

**නිදහස් කිරීම් සීමා කිරීම**

i. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත් භාණ්ඩ සඳහා වන ජා.ගො. බදු නිදහස රේගුවේ දී ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්දට සීමා කරන ලදි.

ii. අදාළ අනුප්‍රමාණ මත ආයෝජන අරමුදල් ගිණුමෙහි අරමුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම හේතුකොටගෙන මූල්‍ය සේවා සඳහා නිදහස් කිරීම අවසන් කරන ලදි.


iii. ට්‍රැක්ටර් විකිණීමෙන් ලැබෙන පිරිවැටුම මත නිදහස, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ට්‍රැක්ටර් සඳහා පමණක් සීමා කරන ලදි. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8701.10.10, 8701.10.90, 8701.20.10, 8701.90.10, 8701.90.20 යටතේ වන ට්‍රැක්ටර් ආනයනය කිරීම බද්දට යටත් කරන ලදි.

iv. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 3003.20.11, 3003.20.12, 3003.20.13, 3003.20.15, 3003.20.12, 3004.20.11, 3004.20.12, 3004.20.13, 3004.20.15, 3004.20.12, යටතේ වන ඖෂධ ආනයනය කරන අවස්ථාවේ දී ජා.ගො. බද්දට යටත් කරන ලදි.

## 2.12 ආර්ථික සේවා ගාස්තු (ESC) රැස්කිරීම

අදාළ වර්ෂය තුළ රැස්කරන ලද සමුච්චිත ආ.සේ.ගා. රු. මිලියන 6,154 කි. සමස්ත ආදායමට එහි දායකත්වය 1.2% ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුවෙන් 73.27% කි.

| වගුව 16 - ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම් රැස්කිරීම (රු.) | % |
| 2014 | 8,400,000,000 | 6,154,508,246 | 23% |
| 2013 | 12,263,000,000 | 6,525,600,863 | 52% |



සටහන 08
ආර්ථික සේවා ගාස්තු රැස්කිරීම
2014

## 2.13 උපයන විට ගෙවීමේ බදු (PAYE) රැස්කිරීම

සේවා නියුක්ත ආදායම මත ආදායම් බද්දේ කොටසක් වශයෙන් උ.වි.ගෙ. (PAYE) ක්‍රමය යටතේ වසර තුළ රැස්කරන ලද දළ ආදායම 2013 වසරේ වූ රු.මිලියන 18,558 ට සාපේක්ෂව රු.මිලියන 22,297 ක් විය.

උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ආදායම් බදු ගෙවන සේවා නියුක්තින් සංඛ්‍යාව 354,258 ලෙස වාර්තා වූ අතර (ඇතැම් සේවා යෝජකයින් විසින් සපයන ලද අසම්පූර්ණ ප්‍රකාශනවල සේවක සංඛ්‍යාව ඇතුළත් නොවේ.) උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ සේවා යෝජකයින්ගේ සංඛ්‍යාව 12,104 කි.

| වගුව 17 - උපයන විට ගෙවීමේ බදු සහ ආදායම් මට්ටම් විශ්ලේෂණය කිරීම | | | | |
|---|---|---|---|---|
| ආදායම් පරාසය (රුපියල්) | | සමස්ත දළ පාරිශ්‍රමිකය (රු.) | සේවා නියුක්තිකයින් සංඛ්‍යාව | උ.වි.ගෙ. යටතේ ගෙවන ලද බදු (රු.) |
| 600,000 ට අඩු | බදු අඩු නොකළ | 124,127,156,637 | 616,982 | - |
| | බදු අඩු කළ | 16,485,271,005 | 46,083 | 158,390,341 |
| 600,001-1,100,000 | | 82,025,547,639 | 100,178 | 1,214,225,160 |
| 1,100,001-1,600,000 | | 49,257,520,928 | 36,782 | 1,487,429,085 |
| 1,600,001-2,100,000 | | 22,003,982,290 | 12,263 | 1,133,809,994 |
| 2,100,001-2,600,000 | | 11,969,417,045 | 5,196 | 847,263,825 |
| 2,600,001-3,600,000 | | 13,767,274,017 | 4,577 | 1,406,886,770 |
| 3,600,000 ට වැඩි | | 43,958,632,004 | 6,284 | 7,887,786,569 |
| | | 8,324,313,513 | 97,617 | 935,100,049 |
| **එකතුව** | | **371,919,115,078** | **925,962** | **15,070,891,793** |

සටහන: 2013/2014 තක්සේරු වර්ෂය මත පදනම්ව සේවා යෝජකයින් විසින් ඉදිරිපත් කළ සම්පූර්ණ කරන ලද වාර්තාවලට අනුව ඉහත තොරතුරු සපයා ඇත.

## 2.14 රඳවා ගැනීමේ බදු (පොළිය සහ නිශ්චිත ගාස්තු මත)


පොළිය මත රඳවා ගැනීමේ බදු රැස්කිරීම වසර තුළදී රුපියල් 69,402,270,951 ක් වූ අතර එකී රැස්කිරීම් වලින් රු.55,880,945,735 ක් රජයේ සුරැකුම්පත් වලින් ද (2013 වසරේ දී රු.62,704,548,497) ඉතිරිය අනෙකුත් සාධන පත්‍රයන්ගෙන් ද ලැබුණි. පොළිය මත රඳවාගැනීමේ බදු ආදායම පෙර වසරට වඩා රුපියල් මිලියන 8,277 ක අඩුවීමක් පෙන්වයි.

## 2.15 ඔට්ටු සහ සුදු බදු රැස්කිරීම

වර්ෂය තුළ ඔට්ටු සහ සුදු බදු රැස්කිරීම රු.815,175,141 ක් විය. වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අගය හා සසඳා බලන කළ මෙමගින් රු.684,824,859/- ක පහළයාමක් පිළිඹිබු වේ. 2013 සහ 2014 වර්ෂ තුළ දී ඔට්ටු සහ සුදු බදු රැස්කිරීම එහි ඇස්තමේන්තුගත අගය හා සසඳා බැලීමක් 18 වන වගුවේ දැක්වේ.

| වගුව 18 - ඔට්ටු හා සුදු බදු රැස් කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම(රු.) | ආදායම රැස් කිරීම (රු.) | % |
| 2014 | 1,500,000,000 | 815,125,141 | 54% |
| 2013 | 850,000,000 | 521,820,451 | 20% |

සටහන 09
ඔට්ටු හා සුදු බදු රැස්කිරීම
2014




## 2.16 ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම

2014 වසර තුළ ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ආදායම් රැස්කිරීම රු.841,828,584 ක් විය. මෙම ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු ගෙවීම සඳහා ලියාපදිංචි මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව 304 ක් විය.

19 වන වගුව ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්දෙහි ආදායම් ඇස්තමේන්තුව 2013 සහ 2014 වසරවල රැස්කරන ලද ආදායම සමඟ සංසන්දනය කරයි.

| වගුව 19 - ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බදු රැස්කිරීම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම රැස් කිරීම (රු.) | % |
| 2014 | 1,000,000,000 | 841,828,584 | 84% |
| 2013 | 1,250,000,000 | 250,202,422 | 60% |

## 2.17 මුද්දර බදු රැස්කිරීම

මුද්දර බදු ලෙස රුපියල් මිලියන 7,918 ක් වර්ෂය තුළ දී උත්පාදනය විය. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර බදු මාරුකිරීම) පනත ප්‍රකාරව, මුද්දර බදු රැස්කිරීම් සම්පූර්ණ ප්‍රමාණය පළාත් සභාවලට මාරුකරන ලදී. මුද්දර බදු පදනම ඉහළ නැංවීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් උපදේශන හා අධීක්ෂන හමු පවත්වන ලද අතර, ඒ අනුව 2014 වසර තුළ ස්ථාන 191 ක් නිරීක්ෂණයට බඳුන් විය. සමථායන නියෝජිතයින් 8,243 ක් (2014.09.30 දිනට) මුද්දර බදු සඳහා විධිමත්ව ලියාපදිංචි වී තිබූ අතර, ඒ අතුරින් 8,165 දෙනෙකු උපලේඛන ඉදිරිපත් කොට තිබුනේ 100% අනුකූලතාවයක් වාර්තා කරමිනි.

## 2.18 ඉඩම් පැවරීම මත බදු

2013 බදු යෝජනා යටතේ ක්‍රියාත්මක කරන ලද ඉඩම් බද්දෙන් වසර සඳහා රැස්කිරීම රුපියල් මිලියන 579 ක් වූ අතර, එය වසර සඳහා ඇස්තමේන්තුගත අගයෙන් 96.58% කි.

## 2.19 දේශීය ආදායම් රැස්කිරීම 2010 සිට 2014 දක්වා (බදු වශයෙන්)


2010 වසරේ සිට 2014 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීම් බදු වර්ග අනුව 20 වන වගුවේ සඳහන් දත්ත මගින් නිරූපණය කෙරේ. අදාළ බදුවලින් ආදායම වැඩිවීම් සහ අඩුවීම් සහ ඒවා සඳහා පාදක විය හැකි හේතූන් සමඟ මෙම පරිච්ඡේදයේ මීට කළින් ඡේදයේ දී සැලකිල්ලට බඳුන් කරන ලදි.

**වගුව 20 – 2010 සිට 2014 දක්වා දේශීය ආදායම් රැස් කිරීම් - බදු වර්ග අනුව විශ්ලේෂණය**

| බදු වර්ගය | 2010 | | 2011 | | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % | රැස් කිරීම (රු.මි.) | % |
| ආදායම් බද්ද | 117,575 | 27.83 | 135,974 | 30.64 | 157,729 | 35.57 | 199,070 | 40.42 | 191,960 | 37.33 |
| ආර්ථික සේවා ගාස්තු | 18,048 | 4.27 | 21,335 | 4.81 | 14,864 | 3.35 | 6,596 | 1.34 | 6,155 | 1.20 |
| එකතු කළ අගය මතබදු | 219,563 | 51.97 | 215,420 | 48.54 | 204,656 | 46.15 | 217,687 | 44.20 | 237,915 | 46.27 |
| හර බදු | 10,843 | 2.57 | 4,232 | 0.95 | - | - | - | - | - | - |
| ඔට්ටු හා සූදු බදු | 295 | 0.07 | 286 | 0.06 | 289 | 0.07 | 592 | 0.12 | 815 | 0.16 |
| කොටස් ගනුදෙනු බද්ද | 2273 | 0.54 | 3,264 | 0.74 | 1,285 | 0.29 | 1,197 | 0.24 | 2,048 | 0.40 |
| පිරිවැටුම් බද්ද | 388 | 0.09 | 131 | 0.03 | 138 | 0.03 | 218 | 0.04 | 472 | 0.09 |
| මුද්දර බද්ද | 4,440 | 1.05 | 7,217 | 1.63 | 6,535 | 1.47 | 6,884 | 1.40 | 7,918 | 1.54 |
| භාණ්ඩ හා සේවා බද්ද | 39 | 0.01 | 25 | 0.01 | 12 | - | 16 | - | 3 | - |
| ජාතික ආරක්ෂක බද්ද | 23 | 0.01 | 15 | - | 4 | - | 2 | - | 14 | - |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 830 | 0.20 | 1,106 | 0.25 | 710 | 0.16 | 751 | 0.15 | 842 | 0.16 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 46,022 | 10.89 | 53,501 | 12.05 | 57,106 | 12.88 | 59,397 | 12.06 | 65,354 | 12.71 |
| ඉඩම් බද්ද | - | - | - | - | - | - | 97 | 0.02 | 579 | 0.11 |
| සමාජ වගකීම් බද්ද | 2,173 | 0.51 | 1,324 | 0.30 | 127 | 0.03 | 32 | 0.01 | 85 | 0.02 |
| **රැස් කිරීම්වල එකතුව** | **422,512** | **100.00** | **443,830** | **100.00** | **443,455** | **100.00** | **492,539** | **100.00** | **514,160** | **100.00** |

**සටහන 10**

**2010 සිට 2014 දක්වා දේශීය ආදායම් රැස්කිරීම් බදු අනුව විශ්ලේෂණය**



# පරිච්ඡේදය 3

# වියදම් සහ ඵලදායිතා අනුපාතය

වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි මුළු වියදම රුපියල් මිලියන 3,088 ක් වූ අතර, පසුගිය වසරේ අගය වූ රු. මිලියන 1,876 සමඟ සසඳා බැලීමේ දී එය 102% ක ඉහළයාමක් වාර්තා කරයි. මුළු වියදමෙන් 64.85% ක් නැතහොත් රු.මිලියන 2,002 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කරන ලදි. 2013 වසරේ දී, අනුරූපී අගය රු.මිලියන 1,683 ක් විය. වේතන සඳහා වූ වියදම 2013 වසරේ පැවති රු.මිලියන 1,272 ට සාපේක්ෂව 11.08% කින් ඉහළ යාමකි. මුළු වියදමෙන් 45.78% ක් සහ පුනරාවර්තන වියදමෙන් 70.60% කින් සමන්විත වූ මෙම අගය විශාලතම තනි වියදම් ආයිතමය විය.

2013 වර්ෂය හා සසඳා බලන කළ වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය 463.57% ක වැඩිවීමක් වාර්තා කරන ලද අතර එය රු.මිලියන 1,086 ට ළඟා වී ඇත. මෙම අගය 2013 වසරේ දී රු.මිලියන 193 ක් විය. දෙපාර්තමේන්තුවේ මුළු වියදමෙන් 35.15% ක් ප්‍රාග්ධන වියදම් නියෝජනය කරයි.


2013 වසරේ ප්‍රකාශිත යෝජනා පරිදි, දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂතාවය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර ගන්නා ලද අතර වසර තුළ මෙම ව්‍යාපෘතියට අදාළව කරන ලද ආයෝජනය රු.මිලියන 806.80 ක් විය.

## 3.1 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම් 2013 ,2012 සහ 2014 වර්ෂ සමඟ සැසඳීම


වගුව 21 - මුළු වියදම් 2012, 2013 සහ 2014 වර්ෂ සමඟ සැසඳීම

| විස්තරය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|
| | ( රු.'000 ) | % | ( රු.'000 ) | % | ( රු.'000 ) | % |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පඩිනඩි | 1,209,700 | 75.40% | 1,272,722 | 67.85% | 1,413,734 | 45.78% |
| ගමන් වියදම් | 24,231 | 1.51% | 19,124 | 1.02% | 17,722 | 0.57% |
| සැපයුම් | 61,851 | 3.86% | 67,269 | 3.59% | 103,684 | 3.36% |
| නඩත්තු | 33,851 | 2.11% | 30,999 | 1.65% | 63,671 | 2.06% |
| කොන්ත්‍රාත් සේවා | 210,813 | 13.14% | 265,284 | 14.14% | 372,162 | 12.05% |
| පැවරුම් | 21,761 | 1.36% | 27,871 | 1.49% | 31,438 | 1.02% |
| වෙනත් | 60 | 0.00% | | | | |
| **උප එකතුව** | **1,562,267** | **97.38%** | **1,683,269** | **89.73%** | **2,002,411** | **64.85%** |
| ප්‍රාග්ධන වියදම් | | | | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම | 19,893 | 1.24% | 131,414 | 7.01% | 101,614 | 3.29% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 13,875 | 0.86% | 40,243 | 2.15% | 49,343 | 1.60% |
| ධාරිතා ගොඩනැගීම | 8,293 | 0.52% | 20,963 | 1.12% | 127,793 | 4.14% |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | | | | | 806,802 | 26.13% |
| **උප එකතුව** | **42,061** | **2.62%** | **192,620** | **10.27%** | **1,085,552** | **35.15%** |
| **මුළු එකතුව** | **1,604,328** | **100%** | **1,875,889** | **100%** | **3,087,963** | **100.00%** |

සටහන 11
මුළු වියදම්– 2012, 2013 සහ 2014




සටහන 12
පුනරාවර්තන වියදම් විශ්ලේෂණය 2014



## 3.2 ඵලදායිතා අනුපාතය

2014 වසරේ දී දෙපාර්තමේන්තුවේ මුළු වියදම රුපියල් 3,087,962,992/- වූ අතර, රැස් කළ ආදායම රුපියල් 514,160,713,222/- ක් විය. ඵලදායී අනුපාතය (එනම්, වියදම් කළ සෑම රුපියලක් සඳහාම රැස් කළ ආදායම) 166:1 ක් ලෙස ගණනය කෙරේ. එනම් රුපියල් 100 ක් රැස් කිරීමේ පිරිවැය ශත 60 කි. රු.100 ක් රැස්කිරීමේ පිරිවැය ආනයන මත එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩ නැගීමේ බදු රහිතව ගත් කළ ශත 79 කි. (පෙර වර්ෂයේ දී මෙම අගයන් පිළිවෙලින් ශත 36 සහ ශත 50 ක් විය.)

වගුව 22 - ආදායම් රැස් කිරීම, මුළු වියදම හා එකතු කිරීමේ පිරිවැය (රු. මිලියන)

| විස්තරය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| ආදායම් රැස් කිරීම | | | |
| ආදායම් බද්ද | 157,728.90 | 199,070.03 | 191,960.05 |
| ආර්ථික සේවා ගාස්තු | 14,864.24 | 6,595.60 | 6,154.51 |
| එකතු කළ අගය මත බද්ද | 204,656.03 | 217,686.92 | 237,915.43 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 57,105.79 | 59,397.33 | 65,353.98 |
| හර බද්ද | -0.48 | -0.08 | - |
| ඔට්ටු හා සූදු බද්ද | 289.18 | 591.87 | 815.18 |
| කොටස් ගනුදෙනු බද්ද | 1,285.74 | 1,197.41 | 2,048.05 |
| පිරිවැටුම් බද්ද | 138.26 | 218.08 | 472.18 |
| මුද්දර බද්ද | 6,535.31 | 6,884.39 | 7,918.14 |
| භාණ්ඩ හා සේවා බද්ද | 11.99 | 15.97 | 3.46 |
| ජාතික ආරක්ෂක බද්ද | 3.93 | 2.15 | 13.77 |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 709.65 | 750.91 | 841.83 |
| ඉඩම් බද්ද | | 96.74 | 579.47 |
| සමාජ වගකීම් බද්ද | 127.22 | 32.11 | 84.66 |
| **මුළු එකතුව** | **443,455.76** | **492,539.43** | **514,160.71** |
| **වියදම්** | | | |
| **පුනරාවර්ථන වියදම්** | | | |
| පඩිනඩි | 1,209.70 | 1,272.72 | 1,413.73 |
| ගමන් වියදම් | 24.23 | 19.12 | 17.72 |
| සැපයුම් හා උපකරණ | 61.85 | 67.27 | 103.68 |
| නඩත්තු හා අලුත්වැඩියා | 33.85 | 31 | 63.67 |
| සේවා | 210.81 | 265.28 | 372.16 |
| මාරු කිරීම් | 21.76 | 27.87 | 31.44 |
| වෙනත් | 0.06 | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් | 19.89 | 131.41 | 101.61 |
| අත්පත්කර ගැනීම් | 13.88 | 40.24 | 49.34 |
| ධාරිතා ගොඩනැගිලි | 8.29 | 20.96 | 127.79 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | - | - | 806.80 |
| **මුළු වියදම** | **1,604.32** | **1,875.89** | **3,087.94** |
| | | | |
| **රු. 100 බැගින් එකතු කිරීමේ පිරිවැය** | **0.36** | **0.38** | **0.6** |
| **ආනයනමත එකතු කළ අගය මත බදු හා ජා.ගොඩ. බදු හැර රු.100 බැගින් එකතු කිරීමේ පිරිවැය** | **0.5** | **0.5** | **0.79** |

## 3.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන ලද විගණනවලට සියලු වියදම් එනම්, දෛනික වාහන ධාවන සටහන් (ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වාගෙන යනු ලබන), පඩි ලැයිස්තු, වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා, බැංකු සැසඳුම් ප්‍රකාශන (මහජන බැංකුව, ලංකා බැංකුව සහ මහ බැංකුව) පරීක්ෂා කිරීම ඇතුළත් විය. තවද මෙයට අතිරේක වශයෙන්, අගරු චෙක්පත්වල මුදල් අයකර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග, එ.අ.බ. සහ ආදායම් බදුවලින් ආපසු ගෙවීම්, අග්‍රිම ගිණුම් සහ අග්‍රිම මුදල් ගිණුම් පරීක්ෂා කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් වේ.

# පරිච්ඡේදය 4

# පැහැර හරින ලද බදු

## 4.1 පැහැර හරින ලද බදු

23 වන වගුවෙන් 2014.12.31 දිනට පැහැර හරින ලද බදු ප්‍රමාණයන්, අත්හිටවූ බදු ප්‍රමාණයන්, දණ්ඩන සහ රැස් කරගත හැකි පැහැර හැර ඇති බදු ප්‍රමාණයන් නිරූපණය කරයි.

**වගුව 23 - පැහැර හරින ලද බදු විශ්ලේෂණය - 2014.12.31 දිනට**

| බදු වර්ගය | පැහැර හරින ලද දළ බද්ද (රු.) | දඩ මුදල (රු.) | දණ්ඩන හැර මතභේදයට තුඩු දුන් බදු (රු.) | මතභේදයට තුඩු දුන් බදුවලට අදාළ දණ්ඩන (රු.) | රැස් කළ හැකි බදු (රු.) | රැස් කළ හැකි දණ්ඩන(රු.) |
|---|---|---|---|---|---|---|
| ආදායම් බද්ද | 56,899,485,469 | 37,253,768,193 | 48,386,379,832 | 33,389,149,188 | 8,513,105,637 | 3,864,619,005 |
| ආදායම් බද්ද මත අධිභාරය | 406,775,534 | 269,440,138 | 404,387,151 | 268,245,948 | 2,388,383 | 1,194,190 |
| ආදායම් බද්ද (පොළිය මත රඳවා ගැ. බදු) | 1,390,837,523 | 635,829,057 | 1,356,563,354 | 592,897,671 | 34,274,169 | 42,931,386 |
| එ.අ.බ. | 44,497,939,944 | 29,802,383,798 | 39,717,299,223 | 25,770,072,800 | 4,780,640,721 | 4,032,310,998 |
| එ.අ.බ. (මූල්‍ය සේවා) | 8,593,768,538 | 4,842,592,562 | 8,550,240,806 | 4,830,389,132 | 43,527,732 | 12,203,430 |
| ආ.සේ. ගා. | 7,117,628,614 | 3,141,589,723 | 4,335,790,517 | 2,210,143,380 | 2,781,838,097 | 931,446,343 |
| ජා.ගො.බ. | 2,727,620,407 | 1,920,389,170 | 1,614,856,989 | 1,217,591,210 | 1,112,763,418 | 702,797,960 |
| මුද්දර බද්ද | 9,732,724 | 3,773,302 | - | - | 9,732,724 | 3,773,302 |
| හර බද්ද | 2,215,581,368 | - | 2,215,581,368 | - | - | - |
| පිරිවැටුම් බද්ද | 2,611,068,311 | 1,271,691,854 | 2,611,068,311 | 1,271,691,854 | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 945,024,420 | 1,038,025,892 | 945,024,420 | 1,038,025,892 | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 1,538,591,036 | 627,138,614 | 1,538,591,036 | 627,138,614 | - | - |
| **ජාතිය ගොඩනැගීමේ දායක මුදල** | 22,443,029 | 6,561,055 | 22,443,029 | 6,561,055 | - | - |
| ධන බද්ද | 851,542 | 473,924 | 851,542 | 473,924 | - | - |
| ත්‍යාග බද්ද | 2,409 | 1,204 | 2,409 | 1,204 | - | - |
| සමාජ වගකීම් බද්ද | 2,111,474 | 154,110 | 1,864,758 | 147,171 | 246,716 | 6,939 |
| සමථයකට පත්වන දණ්ඩන | - | 283,067,976 | - | 115,718,169 | - | 167,349,807 |
| **එකතුව** | **128,979,462,342** | **81,096,880,572** | **111,700,944,745** | **71,338,247,212** | **17,278,517,597** | **9,758,633,360** |

සටහන:

i. අදාළ එක් එක් බදු වර්ගය යටතේ පවත්නා වූ සමුච්චිත ශේෂ ප්‍රමාණය මුළු හිඟබදු ප්‍රමාණය මගින් නියෝජනය කෙරේ. කෙසේ වෙතත්, ඉහත වර්ගීකරණය කර ඇති පරිදි නොගෙවූ බදු ඒ ස්වරූපයෙන්ම සම්පූර්ණයෙන්ම හිඟව නොපවතී.

ii. කවර වූ හේතුවක් මතතක්සේරුවක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී (බදු ගෙවන්නා විසින් වාර්තා ඉදිරිපත් නොකිරීම, වාර්තාව පදනම් කොට ගෙන බදු නොගෙවීම, සාවද්‍ය වාර්තා හෝ ප්‍රකාශන ඉදිරිපත් කිරීම) නොගෙවූ හෝ හිඟ මුදලක් ඇතිවේ. නියමිත දිනට බදු නොගෙවීම වෙනුවෙන් දණ්ඩන මුදල සාමාන්‍යයෙන් 10% ක් වන අතර, ආදායම් බදු සම්බන්ධයෙන් එය 50% ක බදු ප්‍රමාණයක් කරා ළඟා වනතුරු නොගෙවන ලද සෑම මාසයක් සඳහා ම 2% ක ප්‍රමාණයක් සහ එ.අ.බ. සම්බන්ධයෙන් 100% ක ප්‍රමාණයක් වේ.

iii. තක්සේරු කිරීම්වලට එරෙහිව බදු ගෙවන්නන් විසින් අභියාචනා ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී සහ ඉන් අනතුරුව ඔවුන් විසින් තම අභියාචනා අයිතිවාසිකම් සඳහා ඉල්ලුම්කර ඇති පරිදි නිරාකරණය කිරීම සිදු කරනු ලබන විටඇතැම් නඩු අවස්ථා සම්බන්ධයෙන් ඉහළ අභියාචනා මට්ටම් දක්වා (අභියාචනා කොමිසම, අභියාචනාධිකරණය ආදිය) යොමු කරනු ලැබිය හැකි ය. මෙම බදු ප්‍රමාණයන්මතභේදයට තුඩු දුන් බදු, දණ්ඩන හෝ අත්හිට වූ බදු ලෙස වර්ගීකරණය කළහැකිය. අභියාචනා විසඳීමේ දී එකතු කරන ලද දණ්ඩන සමඟ තක්සේරු කළයම් අතිරේක ප්‍රමාණය විසර්ජනය කළයුතු වේ.

## 4.2 පැහැර හරින ලද බදු අඩුකිරීම සඳහා සැලසුම්

පැහැර හරින ලද බදු අඩුකිරීම වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉලක්කගත කටයුතු අතර තවත් ප්‍රමුඛ කාර්යයක් වූ අතර ඒ සඳහා වන සැලසුම් පහත සඳහන් වේ.

(අ) හිඟ බදු අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ පියවර පිළිබඳ අදාළ ප්‍රඥප්තීන්වල සඳහන් වේ. තක්සේරු නිකුත් කිරීමෙන් එවැනි පියවර අඛණ්ඩව ගනු ලැබුව ද, සැලකිය යුතු බදු ප්‍රමාණයක් හිඟව පවත්නා බව ද දැකගත හැකිය.

(ආ) 2010 අංක 16 දරන හිඟ බදු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි හිඟ බදු අයකර ගැනීමේ ඒකකය විසින් අදාළ හිඟ බදු වාර්තා පිළියෙල කර ඇති අතර, අතිරේක අධිකාරිත්වයක් සහිත ඵලදායී ලෙස බදු ආපසු අයකර ගැනීමේ කටයුතු තුළින් වඩාත් යහපත් ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. (යම් යම් අවස්ථාවන්හි දී හිඟ බදු අයකර ගැනීම සඳහා මෙන්ම ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිමත් සහ වේගවත් ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා වන පනතකි.)

## 4.3 හිඟ බදු ප්‍රමාණය 3% මට්ටමෙහි පවත්වා ගැනීම.

2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව, 2010 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් ලත් වර්ෂයක අවසානය වන විට මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් නීතියක් යටතේ පැහැර හැර ඇති එහෙත් ඊට උපචිත වූ මුදලක් හෝ අත්හිටවූ හෝ විලම්භනය කරන ලද බදු මුදලක කොටස හැර, බදුවල මුළු එකතුව ඊට පෙරාතුව වූ වර්ෂයේ මුළු බදුවල එකතුවට වැඩිවන්නේ යම් ප්‍රමාණයකින් ද, එම බදු මුදල් ප්‍රමාණය එකී පෙරාතුවම වූ වර්ෂයේ එම නීතිය යටතේ පනවනු ලැබූ සහ නියම කරනු ලැබූ බදුවලින් සියයට තුනක් නොඉක්මවන බවට වගබලාගැනීම කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

ඒ අනුව,

| | |
|---|---|
| 2014.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | රු.17,278,517,597 |
| අඩුකලා | |
| 2013.12.31 දිනට ශුද්ධ හිඟබදු ප්‍රමාණය | රු.11,439,439,119 |
| 2014 වර්ෂයේ හිඟ බදු අඩුවීම | රු. **5,839,078,478** |
| 2014.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු බදු රැස්කිරීම් | රු.467,162,276,566 |
| 2013 වර්ෂයේ මුළු බදු රැස්කිරීම් වලින් 3% | රු.**14,014,868,297** |

එබැවින් 2014 වසරේ දී හිඟ බදුවල ශුද්ධ එකතුවීමක් දක්නට නොමැත. ඒ අනුව 2010 අංක 16 දරන හිඟ බදු (විශේෂ විධිවිධාන) පනතින් අපේක්ෂිත ආකාරයට එම අගය පෙර වර්ෂයේ මුළු බදු රැස්කිරීමෙන් 3% කට වඩා අඩු අගයක් ගනී.

# පරිච්ඡේදය 5

# විගණන, අතිරේක බදු රැස්කිරීම, ආපසු ගෙවීම්, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සහ අභියාචනා

## 5.1 විගණන

ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ඒකකයෙහි ස්වභාවය හා විශාලත්වයට අනුකූලව, සමස්ථ බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව හැකි පමණ පුළුල් ලෙසින් ආවරණය කිරීමේ අරමුණින් යුතුව විගණන සහ විමර්ශන කටයුතු සිදුකරන ලදි. විමර්ශන සම්පත් වඩාත් ඵලදායි ලෙස භාවිත කිරීම තුළින් සුවිශාල බදු ගෙවන්නන්ට අදාළව ලාභාංශ ගෙවා ඇති බව නිරීක්ෂණය වී ඇත. සමාලෝචනයට බඳුන් කරන වසර තුළ, අවසන් රාජකාරිය (back duty) සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමේ මහඟු ඵල ගෙන දෙමින් මෙම වර්ගය සම්බන්ධයෙන් තේරීමේ ක්‍රියාවලිය දැඩි අවධානයට යොමු කර ඇත.

ඒ අනුව, විගණන කාර්යයන් වඩාත් සතුටුදායක අයුරින් සිදුකළ අතර එමගින් අතිරේක බදු ප්‍රමාණයක් රැස්කර ගැනීමට හැකි විය. එලෙස රැස්කර ගන්නා ලද අතිරේක බදු ප්‍රමාණය 24 වන වගුවෙහි දක්වා ඇත.

**වගුව 24 - වර්ෂය තුළ සිදුකරන ලද විගණන සහ අතිරේක බදු රැස්කිරීම පිළිබඳ විස්තර (රු.'000)**

| | ආදායම් බද්ද | එ.අ.බ. | ආ.සේ.ගා. | උ.වි.ගෙ. | ජා.ගො.බ. | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 12,752,079 | 10,518,518 | 454,457 | 209,147 | 1,996,733 | 2,706,956 | 28,637,890 |
| වර්ෂය තුළ රැස්කරන ලද මුළු අතිරේක බදු ප්‍රමාණය | 11,031,622 | 9,138,496 | 365,514 | 192,932 | 1,408,365 | 2,618,089 | 24,755,018 |
| 2013 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද විගණන සංඛ්‍යාව | **5,091** | | | | | | |
| 2013 වර්ෂය තුළ දී අවසන් කරන ලද විගණන සංඛ්‍යාව | **5,038** | | | | | | |

**වගුව 25 - සංස්ථාපිත සහ අනෙකුත් අංශ වලින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය (දණ්ඩන ඇතුළුව)**

| විස්තරය | තක්සේරු කරන ලද හා එකඟ වූ අතිරේක ආදායම/පිරිවැටුම (රු.) | තක්සේරු කරන ලද සහ එකඟ වූ අතිරේක බදු (රු.) | | | | රැස් කරන ලද අතිරේක බදු (රු.) හිලව් කළ ආපසු ගෙවීම් ඉල්ලීම් ඇතුළුව) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත විශාල බදු ගෙවන්නන් | සංස්ථාපිත අනෙකුත් | අනෙකුත් ඒකක | එකතුව | |
| ආදායම් බද්ද | 49,593,380 | 10,241,508 | 1,137,733 | 1,372,838 | 12,752,079 | 11,031,622 |
| එකතු කළ අගය මත බද්ද | 43,916,221 | 5,382,048 | 2,211,630 | 2,924,840 | 10,518,518 | 9,138,496 |
| ආර්ථික සේවා ගාස්තු | 74,217,241 | 289,083 | 78,648 | 86,726 | 454,457 | 365,514 |
| උපයන විට ගෙවීම් | 1,209,720 | 54,953 | 80,401 | 73,793 | 209,147 | 192,932 |
| ජ.ගො.බ. | 105,044,798 | 943,206 | 491,258 | 562,269 | 1,996,733 | 1,408,365 |
| අනෙකුත් | 7,444,417 | 2,665,305 | 39,964 | 1,687 | 2,706,956 | 2,618,089 |
| **එකතුව** | **281,425,777** | **19,576,103** | **4,039,634** | **5,022,153** | **28,637,890** | **24,755,018** |

## 5.2 අභියාචනා

තක්සේරුවලට එරෙහිව ලැබූ අභියාචනා 965 ක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී විසඳා අවසන් කරන ලද අතර අභියාචනා විශ්ලේෂණය කිරීමේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| වගුව 26 - ලැබූ සහ නිරාකරණය කරන ලද අභියාචනා සම්බන්ධ විශ්ලේෂණය | | ආදායම් බද්ද | එ.අ.බ | ආ.සේ.ගා | ජා.ගො.බ | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | අංශ APL 2 පරිදි | 114 | 135 | 0 | 15 | 2 | 266 |
| | අභියාචනා අංශය (APL 2 පරිදි) | 49 | 460 | 20 | 23 | 0 | 552 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 53 | 246 | 1 | 5 | 2 | 307 |
| වර්ෂය තුළ දී ලියාපදිංචිය (APL 2 පරිදි) | | | **338** | **9** | **174** | **3** | **1030** |
| අවසන් කළ | නිර්ණය කරන ලද (දේ.ආ.කො.ජ.) | 23 | 258 | 1 | 0 | 2 | 284 |
| | අංශ (APL 4 පරිදි) | 186 | 9 | 0 | 26 | 0 | 221 |
| | අභියාචනා අංශය | 83 | 348 | 17 | 10 | 2 | 460 |
| දේ.ආ.කො.ජ. ට විභාගය සඳහා ඉදිරිපත් කළා | | | **374** | **8** | **43** | **0** | **566** |
| 2014.12.31 දිනට ශේෂය | ඒකක (APL 2 පරිදි) | 129 | 9 | 0 | 6 | 0 | 144 |
| | *අභියාචනා අංශය (APL 2 පරිදි) | 130 | 193 | 4 | 127 | 3 | 457 |
| | දේ.ආ.කො.ජ. විසින් අභියාචනා විමර්ශනයට භාජනය කිරීම | 171 | 362 | 8 | 48 | 0 | 589 |
| *වර්ෂය තුළ දී අභියාචනා අංශයට ලැබුණ ලිපිගොනු | | | **149** | **0** | **65** | **5** | **311** |

## 5.3 එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණන

දෙපාර්තමේන්තුවේ විශේෂ එකතු කළ අගය මත බදු විශේෂ විගණන ඒකකය මගින් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් හි පශ්චාත් විගණනයන් ලෙස බදු අයකළ හැකි කාලපරිච්ඡේද 3, 110 ක් ආවරණය වන පරිදි, වර්ෂය තුළ දී සිද්ධීන් (ලිපිගොනු) 220 ක් සම්පූර්ණ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් අතිරේක බදු ලෙස රු.934,779,904/- ක මුදලක් රැස්කරගත හැකි විය.

## 5.4 අය ක්‍රියාමාර්ග

වර්ෂය තුළ බදු අය කිරීම් සඳහා කටයුතු කළ ලිපිගොනු සංඛ්‍යාව හා නිවේදන සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

| වගුව 27 - අය ක්‍රියා මාර්ග | සිද්ධීන් | දැන්වීම |
|---|---|---|
| තහනම් නියෝග නිකුත් කිරීම | 1,082 | 1,364 |
| නඩු පැවරීම් | 1064 | 647 |
| වෙනත් ක්‍රියා මාර්ග | 4,139 | 3,005 |
| තහනම් නියෝග නිකුත් කිරීම | 6,285 | 5,016 |

## 5.5 ආපසු ගෙවීම්

වර්ෂය තුළ දී සිදු කරන ලද ආපසු ගෙවීම් පිළිබඳ විශ්ලේෂණය (හිඟ බදු සඳහා හිලව් කළ ආපසු ගෙවීම් හැර) පහත දැක්වේ.

| වගුව 28 - ආපසු ගෙවීම් විශ්ලේෂණ | 2013 | | 2014 | |
|---|---|---|---|---|
| බදු වර්ගය | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % | ආපසු ගෙවීම් ප්‍රමාණය (රු.) | එක් එක් බදු වර්ගයේ රැස් කිරීම ශුද්ධ ආදායමට % |
| එකතු කළ අගය මත බදු | 459,692,181 | 0.21% | 1,112,689,379 | 0.47% |
| සංස්ථාපිත ආදායම් බදු | 167,326,086 | 0.20% | 30,901,245 | 0.04% |
| වෙනත් සංස්ථාපිත නොවන ආදායම් බදු | 50,932,924 | 0.59% | 31,600,314 | 0.39% |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බදු | 2,154,419 | 0.84% | 2,275,268 | 1.06% |
| පොළී මත රඳවා ගැනීමේ බදු | 4,326,494 | 0.01% | 8,214,435 | 0.01% |
| උපයන විට ගෙවීමේ බදු | 375,690,454 | 2.02% | 13,934,469 | 0.06% |
| හර බද්ද | 213,182 | - | - | - |
| **එකතුව** | **1,060,335,740** | **0.23%** | **1,199,615,110** | **0.23%** |

වර්ෂය තුළදී එකතු කළ අගය මත ආපසු ගෙවීම් ඉල්ලීම් 2846 ක් රු.මිලියන 1,112.69 ක් වසර සඳහා ආපසු ගෙවා අවසන් කරන ලදි. වසර තුළ ආපසු ගෙවන ලද මුළු මුදලින් රුපියල් මිලියන 224.52 ක මුදලක් සමස්ත හිඟ බදුවලට එරෙහිව මාරුකිරීම හෝ හිලව් කිරීම කරන ලදි.

සරළ කරන ලද එ.අ.බ. යෝජනා ක්‍රමය (SVAT), ණය වවුචර් නිකුත් කිරීමේ ක්‍රමය මගින් ආනයන සහ විශේෂ ව්‍යාපෘතිවල යෙදී සිටින එ.අ.බ. සඳහා ලියාපදිංචි වී සිටින පුද්ගලයන්ගෙන් එ.අ.බ. ආපසු ඉල්ලීම් සංඛ්‍යාව අවම කරයි. කොමසාරිස් ජනරාල් විසින් සුපරීක්ෂණය කරනු ලබන මෙම ස.එ.අ.බ. ක්‍රමය යටතේ සුදුසුකම් ලබන පුද්ගලයින් සඳහා සපයනු ලබන භාණ්ඩ හා සේවා ඔවුන්ගේ බද්දට යටත් ආදායමින් සියයට 50 ක් වන විට පුද්ගලයින් වැඩි සංඛ්‍යාවක් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සුදුසුකම් ලබයි. එබැවින්, එ.අ.බ. රැස්කිරීමක් සිදුකළ නොහැකි අතර, මීට පෙර ගෙවන ලද එ.අ.බ. යෙදවුම් බදු ලෙස ඉල්ලීමක් කරන ලදි.

වසර තුළ දී පුද්ගලයින් 539 දෙනෙකු ස.එ.අ.බ. ක්‍රමය සඳහා ලියාපදිංචි වී ඇත.

**වගුව 29 - සරල කරන ලද එ.අ.බ. බැර වවුචර් විශ්ලේෂණය**

| | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| ආපසු ගෙවන ලද එ.අ.බ. ප්‍රමාණය (රු.) | 6,348,377,132 | 3,149,577,623 | 459,692,181 | 1,112,689,379 |
| වසර තුළ ශුද්ධ ආදායම් රැස්කිරීම % | 2.94% | 1.54% | 0.21% | 0.47% |
| නිකුත් කරන ලද සරල කරන ලද එ.අ.බ. බැර වවුචර්වල එ.අ.බ. කොටසෙහි වටිනාකම | 26,100,132,430 | 41,991,314,893 | 45,337,507,743 | 47,304,211,325 |

# පරිච්ඡේදය 6

# ජාත්‍යන්තර සබඳතා

## 6.1 ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්

ජාත්‍යන්තර වෙළෙඳාමේ දී හෝ ගනුදෙනුවල දී සිදුවන නෛතික ද්විත්ව බදුකරණය සහ ආදායම් පැහැර හැරීම ඉවත් කිරීම හෝ අඩු කිරීම පිණිස රටවල් විසින් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම්වලට එළැඹේ. විදේශ ආයෝජන ඇදගැනීමෙහි ලා ණය යාන්ත්‍රණය, විශේෂඥ දැනුම, නවීන තාක්ෂණය සහ රැකියා අවස්ථා යනාදිය ලබාගැනීම සඳහා මග පෙන්වීම වැනි විවිධාකාරයෙන් මෙම ගිවිසුම් සුවිශේෂී කාර්ය භාරයන් ඉටු කරන බැවින්, ඒවා සංවර්ධනය වෙමින් පවත්නා වූ රටවලට වඩාත් සුවිශේෂී වේ.

මෙයට අතිරේක වශයෙන් ශ්‍රී ලංකාවේ ඇතැම් ගිවිසුම් පාර්ශ්වකරුවන් සමඟ දැනටමත් ඇති කරගෙන තිබෙන පරිදි, ගිවිසුමකට එළඹෙන රටවල් දෙක අතර සමගිය සහ සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ද ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට එළඹෙනු ලැබේ.

පහත 30 වැනි වගුවේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකාව 2014.12.31 දින වන විට රටවල් 42 ක් සමඟ ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහු පාර්ශ්වීය ගිවිසුම්වලට එළැඹ තිබේ. ද්විත්ව බදු ගිවිසුම් සහ බහු පාර්ශ්වීය ගිවිසුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගුව 30 - 2014.12.31 දිනට ද්විත්ව බදු ගිවිසුම් බලපවත්නා රටවල්**

| | රට | ගිවිසුම් අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 01 | ඕස්ට්‍රේලියාව | 1989-18-12 | 657/2 | 1991-08-04 | 1992/93 |
| 02 | බංගලිදේශය | 1986-24-07 | 448/13 | 1987-07-04 | 1989/90 |
| 03 | බෙල්ජියම | 1983-03-02 | 292/6 | 1984-09-04 | 1984/85 |
| 04 | කැනඩාව | 1982-23-06 | 253/8 | 1983-13-07 | 1986/87 |
| 05 | චීනය | 2003-11-08 | 1374/20 | 2005-06-01 | 2006/07 |
| 06 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 1981-22-12 | 228/15 | 1983-20-01 | 1980/81 |
| 07 | ප්‍රංශය | 1981-17-09 | 210/17 | 1982-17-09 | 1982/83 |
| 08 | පින්ලන්තය | 1982-18-05 | 253/8 | 1983-13-07 | 1981/82 |
| 09 | ජර්මනිය (සංශෝධිත) | 1979-13-09 | 113 | 1980-31-10 | 1982/83 |
| 10 | හොංකොං (සීමිත) | 2004-26-03 | 1374/21 | 2005-06-01 | 2005/06 |
| 11 | ඉන්දියාව (සංශෝධිත) | 2013-22-01 | 1828/9 | 2013-17-09 | 2014/15 |
| 12 | ඉන්දුනීසියාව | 1993-03-02 | 789/10 | 1993-21-10 | 1995/96 |
| 13 | ඉරානය | 2000-25-07 | 1187/16 | 2001-06-06 | 2002/03 |
| 14 | ඉතාලිය | 1984-28-03 | 322/4 | 1984-05-11 | 1978/79 |
| 15 | ජපානය | 1967-12-12 | 14803/5 | 1968-29-05 | 1969/70 |
| 16 | කොරියාව | 1984-28-05 | 342/11 | 1985-29-03 | 1980/81 |
| 17 | කුවේටය | 2002-05-02 | 1245/19 | 2002-18-07 | 2002/03 |
| 18 | මලයාසියාව (සංශෝධිත) | 1997-16-09 | 1028/21 | 1998-22-05 | 99/2000 |
| 19 | මොරිෂස් | 1996-12-03 | 958/10 | 1997-15-01 | 1998/99 |
| 20 | නේපාලය | 1999-06-07 | 1116/6 | 2000-26-01 | 2001/02 |
| 21 | නෙදර්ලන්තය | 1982-17-11 | 281/13 | 1984-26-01 | 1979/80 |
| 22 | නෝර්වේ (සංශෝධිත) | 1986-01-12 | 464/4 | 1987-27-07 | 1989/90 |
| 23 | ඕමානය (සීමිත) | 1994-26-07 | 881/7 | 1995-26-07 | 1979/80 |
| 24 | පකිස්ථානය (සංශෝධිත) | 1981-15-10 | 210/17 | 1982-17-09 | 1983/84 |
| 25 | පිලිපීනය | 2000-11-10 | 1237/7 | 2002-21-05 | 2010/11 |
| | | | 1256/27 | 2002-02-10 | |
| 26 | පෝලන්තය | 1980-25-04 | 130 | 1981-27-02 | 1984/85 |
| 27 | කටාර් | 2004-07-11 | 1422/10 | 2005-5-12 | 2008/09 |
| 28 | රුමේනියාව | 1984-19-10 | 371/9 | 1985-15-10 | 1986/87 |
| 29 | රුසියාව | 1999-02-03 | 1101/22 | 1999-15-10 | 2003/04 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 30 | සවුදි අරාබිය (සීමිත) | 1999-16-12 | 1101/23 | 1999-15-10 | 1983/84 |
| 31 | සින්ගප්පූරුව | 1999-29-05 | 57/11 | 1979-10-10 | 1977/78 |
| 32 | ස්විඩනය | 1983-23-02 | 297/28 | 1984-18-05 | 1985/86 |
| 33 | ස්විස්ටර්ලන්තය | 1983-11-01 | 292/6 | 1984-09-04 | 1981/82 |
| 34 | තායිලන්තය | 1988-14-12 | 571/16 | 1989-18-08 | 1990/91 |
| 35 | සවුදි අරාබිය (සීමිත) | 1992-07-07 | 824/13 | 1994-23-06 | 1979/80 |
| 36 | සවුදි අරාබිය(පූර්ණ( | 2003-24-09 | 1346/1 | 2004-21-06 | 2004/05 |
| 37 | එක්සත් රාජධානිය | 1979-21-06 | 60/23 | 1979-02-11 | 1977/78 |
| 38 | අමෙරිකා එක්සත් ජනපදය (සංධානය) | 2002-20-09 | 1298/8 | 2003-21-07 | 2004/05 |
| 39 | U.S.A | 1985-14-03 | 398/4 | 1986-22-04 | |
| 40 | වියට්නාමය | 2005-26-10 | 1455/9 | 2006-24-07 | 2007/08 |
| 41 | සීෂෙල්ස් | 2011-23-09 | 1837/14 | 2013-20-11 | 2015/16 |
| 42 | බෙලාරුස් | 2013-26-08 | 1837/13 | 2013-20-11 | 2015/16 |
| 43 | පලස්තීනය | 2012-16-04 | 1838/8 | 2013-26-11 | 2015/16 |
| 44 | ලක්සම්බර්ග් | 2013-31-01 | 1838/9 | 2013-26-11 | 2015/16 |
| **බහුපාර්ශ්වීය ගිවිසුම්1838/9** | | | | | |
| 1 | සාර්ක් බහුපාර්ශ්වීය ගිවිසුම | 2005-13-10 | 1447/3 | 2006-29-05 | 2011/2012 |

### 6.1.1 2014 වර්ෂය තුළ ද්විත්ව බදු ගිවිසුම්වලට අදාළ කටයුතු

**සිංගප්පූරුව සමඟ සංශෝධිත ගිවිසුම**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලද අතර රාජ්‍ය මට්ටමින් එයට අත්සන් තබන ලදි.

**බහරේන් රාජධානිය සමඟ ගිවිසුම**

2011 වසරේ රාජ්‍ය මට්ටමින් අත්සන් තබන ලද ගිවිසුම 2014 ජනවාරි 01 වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලදි.

## 6.2 අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වයන්

**වගුව 31 - අන්තර් ජාතික බදුකරණ කාර්යයන්හි සහභාගිත්වය**

| | නිලධාරියාගේ නම සහ තනතුර | වැඩ සටහන | රට | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1 | කේ.ඒ.ජී. අබේරත්න මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | බදු ගිවිසුම් සම්මුති සාකච්ඡා පිළිබඳ UN OECD ප්‍රායෝගික වැඩමුළුව. | ඔස්ට්‍රියාව | 2014.05.19 2014.05.23 |
| 2 | ඩබ්ලිව්. අනුලාවතී මහත්මිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | මිල පැවරුම් පිළිබඳ ලෝක සංසදයේ 3 වන වාර්ෂික රැස්වීම. | ප්‍රංශය | 2014.03.26 2014.03.28 |
| 3 | ඩී.එම්.එල්.අයි. දිසානායක මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | මිල පැවරුම් පිළිබඳ ලෝක සංසදයේ 3 වන වාර්ෂික රැස්වීම. | ප්‍රංශය | 2014.03.26 2014.03.28 |
| 4 | ඒ.එන්. ගුරුගේ මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම් සමුළුව. | ප්‍රංශය | 2014.09.24 2014.09.26 |
| 5 | ඒ.ඒ.ඩී.යූ. අබේසිංහ මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ද්විත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ SAARC නිසි බලධරයන්ගේ 3 වන සමුළුව. | භූතානය | 2014.07.28 2014.07.29 |
| 6 | ඩී.ජී.පී.ඩබ්. ගුණතිලක මෙනවිය නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම පිළිබඳ සමුළුව. | ප්‍රංශය | 2014.09.24 2014.09.26 |
| 7 | ජේ.පී.ඩී.ආර්. ජයසේකර මහතා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | යෝජිත චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ දෙවන සම්මුති සාකච්ඡා වටය. | චීනය | 2014.11.26 2014.11.29 |
| 8 | සී.එච්. වීරසිංහ මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම් සමුළුව. | ප්‍රංශය | 2014.09.24 2014.09.26 |
| 9 | එච්.එම්.ඩී. මුණසිංහ මහත්මිය ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT සම්බන්ධව OECD –ලෝක සංසදයේ දෙවන සාකච්ඡාව. | ජපානය | 2014.04.17 2014.04.18 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | කේ.එස්.බී.ආර්.ඩී.එස්. කරුණාරත්න මහත්මිය ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT සම්බන්ධව OECD –ලෝක සංසදයේ දෙවන සාකච්ඡාව. | ජපානය | 2014.04.17<br>2014.04.18 |
| 11 | කේ. ධර්මසේන මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ජාත්‍යන්තර බදුකරණය පිළිබඳ SAARC සම්මන්ත්‍රණය. | ඉන්දියාව | 2014.03.04<br>2014.03.07 |
| 12 | එච්.එම්.ජී. විජේසිංහ මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මිල පැවරුම් සම්බන්ධ ලෝක සංසදයේ තුන්වන වාර්ෂික සාකච්ඡාව. | ප්‍රංශය | 2014.03.26<br>2014.03.28 |
| 13 | ඩී.බී. දිසානායක මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මිල පැවරුම් සම්බන්ධ ලෝක සංසදයේ තුන්වන වාර්ෂික සාකච්ඡාව. | ප්‍රංශය | 2014.03.26<br>2014.03.28 |
| 14 | කේ.ඩී.ඒ.පී. කෝරලේආරච්චි මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මිල පැවරුම් සම්බන්ධ ලෝක සංසදයේ තුන්වන වාර්ෂික සාකච්ඡාව. | ප්‍රංශය | 2014.03.26<br>2014.03.28 |
| 15 | ඩබ්.එස්.කේ. ද කොස්තා මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | මිල පැවරුම් සම්බන්ධ ලෝක සංසදයේ තුන්වන වාර්ෂික සාකච්ඡාව. | ප්‍රංශය | 2014.03.26<br>2014.03.28 |
| 16 | එම්.එස්.එම්. ෆුවාඩ් මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම් සාකච්ඡාව. | ප්‍රංශය | 2014.09.24<br>2014.09.26 |
| 17 | පී.එම්. දිසානායක මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම් සාකච්ඡාව. | ප්‍රංශය | 2014.09.24<br>2014.09.26 |
| 18 | ඒ.ඒ. දයාරත්න මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | OECD 19 වන වාර්ෂික බදු ගිවිසුම් සාකච්ඡාව. | ප්‍රංශය | 2014.09.24<br>2014.09.26 |
| 19 | ජේ.ඒ.ඒ. පරාක්‍රම මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ද්විත්ව බදුකරණය වැළැක්වීම පිළිබඳ SAARC නිසි බලධරයන්ගේ 3 වන සමුළුව. | භූතානය | 2014.07.28<br>2014.07.29 |
| 20 | එච්.එම්.ඩබ්.සී. බණ්ඩාර මහතා ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | VAT සම්බන්ධව OECD –ලෝක සංසදයේ දෙවන සාකච්ඡාව. | ජපානය | 2014.04.17<br>2014.04.18 |
| 21 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා කොමසාරිස් | බදු ගිවිසුම් සම්මුති සාකච්ඡා පිළිබඳ UN OECD ප්‍රායෝගික වැඩමුළුව. | ඔස්ට්‍රියාව | 2014.05.19<br>2014.05.23 |
| 22 | ඩී.ආර්.එස්. හපුආරච්චි මහතා කොමසාරිස් | BEPS ආශ්‍රිත බදු ගිවිසුම් කාර්යයන් ඉදිරියට ගෙන යෑම. | ඩුබායි | 2014.11.25<br>2014.11.27 |
| 23 | කේ.ඩී.එම්.එන්. ගුණතුංග මහතා කොමසාරිස් | VAT සම්බන්ධව OECD –ලෝක සංසදයේ දෙවන සාකච්ඡාව. | ජපානය | 2014.04.17<br>2014.04.18 |
| 24 | ඩබ්.කේ.කේ. ජයරත්න මහතා කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවල බදුකරණය පිළිබඳ CATA වැඩමුළුව. | මලයාසියාව | 2014.06.09<br>2014.06.27 |
| 25 | පී. සුමනසිරි මහතා කොමසාරිස් | බදු ගිවිසුම් සම්මුති සාකච්ඡා පිළිබඳ IRBM-OECD ප්‍රායෝගික ඒකාබද්ධ වැඩමුළුව. | මලයාසියාව | 2014.03.10<br>2014.03.14 |
| 26 | ජේ.ඩී. දිමන්ත මහතා නියෝජ්‍ය කොමසාරිස් | අන්තර් ජාතික ගනුදෙනුවල බදුකරණය පිළිබඳ CATA වැඩමුළුව. | මලයාසියාව | 2014.06.09<br>2014.06.27 |
| 27 | ඒ.එම්. නෆීල් මහතා නියෝජ්‍ය කොමසාරිස් | BEPS හා සම්බන්ධ බදු ගිවිසුම් කාර්යයන් ඉදිරියට ගෙන යෑම. | ඩුබායි | 2014.11.25<br>2014.11.27 |
| 28 | ඩබ්.ආර්.ආර්. වික්‍රමසූරිය මහත්මිය සහකාර කොමසාරිස් | ජාත්‍යන්තර බදුකරණය සහ මිල පැවරුම් සම්බන්ධ SAARC සම්මන්ත්‍රණය. | ඉන්දියාව | 2014.03.04<br>2014.03.07 |
| 29 | එච්.එම්.කේ. පුෂ්පලතා මහත්මිය සහකාර කොමසාරිස් | ජාත්‍යන්තර බදුකරණය සහ මිල පැවරුම් සම්බන්ධ SAARC සම්මන්ත්‍රණය. | ඉන්දියාව | 2014.03.04<br>2014.03.07 |
| 30 | පී.එන්.එම්. පනාගොඩ මහත්මිය සහකාර කොමසාරිස් | ජාත්‍යන්තර බදුකරණය සහ මිල පැවරුම් සම්බන්ධ SAARC සම්මන්ත්‍රණය. | ඉන්දියාව | 2014.03.04<br>2014.03.07 |
| 31 | සී.ජී. බාලසූරිය මහත්මිය සහකාර කොමසාරිස් | BEPS හා සම්බන්ධ බදු ගිවිසුම් කාර්යයන් ඉදිරියට ගෙන යෑම. | ඩුබායි | 2014.11.25<br>2014.11.27 |

# පරිච්ඡේදය 7

# ව්‍යවස්ථා සම්පාදනය

## 7.1 වර්ෂය තුළදී පහත සඳහන් ව්‍යවස්ථාවන් පනවන ලදි.

i. 2014 අංක 08 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
ii. 2014 අංක 09 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත
iii. 2014 අංක 07 දරන එකතු කළ අගය මත (සංශෝධන) පනත
iv. 2014 අංක 10 ජාතිය ගොඩනැගීමේ (සංශෝධන) පනත
v. 2014 අංක 14 දරන ගෙවීම් පැහැර හැරීමේ බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

## 7.2 අනුමත පුණ්‍යායතන

වර්ෂය තුළදී එක් අනුමැතියක් ලබාදී ඇත.

| පුණ්‍යායතනය | (Angel) ඒන්ජල් පදනමේ ළමා නිවාසය |
|---|---|
| ලිපිනය | පන්සල් පාර, මුදුන්කොටුව, මාරවිල. |
| ගැසට් අංකය | 1847 |
| ලියාපදිංචි දිනය | 24/01/2014 |

## 7.3 ගැසට් නිවේදන

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන අදාළ පනත් යටතේ වර්ෂය තුළදී පහත සඳහන් ගැසට් නිවේදන නිකුත් කරන ලදි.

වගුව 32 - 2014 වර්ෂය තුළදී ප්‍රසිද්ධියට පත්කරන ලද ගැසට් නිවේදන

| | ගැසට් අංකය | දිනය | විස්තර |
|---|---|---|---|
| i | 1842/51 | 2014.01.31 | ආදායම් බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ ආදායම් පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ බහරේන් රාජ්‍ය අතර ගිවිසුම |
| ii | 1868/10 | 2014.06.23 | මූල්‍ය සේවා මත එ.අ.බ. |
| iii | 1864/02 | 2014.05.26 | මුද්දර බදු කොටස් |
| iv | 1852/02 | 2014.04.02 | ආ.සේ.ගා. නියමයන් |
| v | 1852/08 | 2014.04.02 | ආදායම් බදු SLFRS ගැලපුම් |
| vi | 1844/02 | 2014.04.02 | (SLTB) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කැස්බෑව බස්නැවතුම්පොළෙහි පැහැර හරින ලද බදු කපා හැරීම |

## 7.4 අර්ථ නිරූපණ කමිටුව

දේශීය ආදායම් පනතේ 208 අ වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2011 වසරේ පත්කරන ලද බදු නීති පිළිබඳ අර්ථ කථනය කිරීම සඳහා වන කමිටුව (CITL) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත වන අතර, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත විය. මෙම කමිටුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පරිපාලනය කරනු ලබන පනත්වල විධිවිධාන අර්ථ නිරූපණයන්, පැහැදිලි කිරීම, මාර්ගෝපදේශ යනාදිය නිකුත් කිරීම සඳහා බැඳී ඇත. කවර හෝ තැනැත්තෙකුට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලිත පනතක විධිවිධානයන්හි ව්‍යාකූලතාවයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් කමිටුවෙහි අර්ථ නිරූපණය ඉල්ලා සිටිය හැකි ය. (කමිටු ලේකම්, ලේකම් අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව) අර්ථ නිරූපණයන් සහ ක්‍රියාපටිපාටීන්ට අදාළව සමානාත්මතාවය සහතික වනු පිණිස අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කිරීම සඳහා මෙම කමිටුවට බලය පවරා ඇත. අදාළ වර්ෂය තුළ දී අර්ථ නිරූපණ 73 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදි. මෙම කමිටුව මගින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර 33 වගුවෙන් දක්වා ඇත.

| වගුව 33 – 2014 වර්ෂය තුළ දී කමිටුව විසින් ලබාදෙන ලද අර්ථ නිරූපණයන් පිළිබඳ විස්තර | | | | | | |
|---|---|---|---|---|---|---|
| **Area** | ආදායම් බද්ද | එ.අ.බ | ජා.ගො.බ | මුද්දර බද්ද | ආ.සෙ.ගා | එකතුව |
| ආදායම් බදු බැදියාව | 6 | 4 | 4 | 3 | 2 | 19 |
| ලාභාංශ | 1 | - | - | - | - | 1 |
| නිදහස් කිරීම් | 3 | 6 | 2 | - | 1 | 12 |
| ලාභ සහ ආදායම නිශ්චය කිරීමේ දී අවසරලත් අඩුකිරීම් | 1 | - | - | - | - | 1 |
| සේවා නියුක්ත ආදායම | 5 | - | - | - | - | 5 |
| සහනදායී අනුප්‍රමාණයන් | 8 | - | - | - | - | 8 |
| අර්ථ නිරූපණය | 8 | - | - | - | - | 8 |
| රඳවා ගැනීමේ බදු මත ණය සුරැකුම්පත් | 1 | 1 | - | - | - | 2 |
| හිලව් යෙදවුම් බදු | - | 7 | - | - | - | 7 |
| ක්‍රියා මාර්ග | - | 2 | - | - | - | 2 |
| ආපසු ගෙවීම් - SDP | - | 1 | - | - | - | 1 |
| වෙනත් | 4 | - | - | - | - | 4 |
| බදු අභියාචනා කොමිෂන් සභාව | | | | | | 1 |
| 2006 අංක 11 දරන මුදල් පනතේ 2 (ආ) වගන්තිය යටතේ සහතිකවල සුදුදුකම | | | | | | 2 |
| **Total** | | | | | | **73** |

# පරිච්ඡේදය 8

# අනෙකුත් කාර්යයන්

## 8.1 බදු සේවා අංශය

බදු සේවා අංශය බදු ගෙවන්නන්ට සහ මහජනතාවට පහසුවෙන් දෙපාර්තමේන්තු සේවා ලබාගත හැකිවන පරිදි පහසුකම් සලසාඇත. උපකාර හෝ තොරතුරු ලබාගැනීමට පැමිණෙන්නා වූ සෑම තැනැත්තෙකුටම සහයෝගය ලබාදීම පිණිස මෙම ඒකකයට නිලධාරීන් යොදවා ඇත. අදාළ අණ පනත්, දෙපාර්තමේන්තු ප්‍රකාශන, ගෙවීම් පත්‍රිකා, ආකෘති පත්‍ර යනාදිය මෙම ඒකකයෙන් ලබාගත හැකි ය. සිදුවිය හැකි ප්‍රමාදයන් හා අපහසුතාවයන් මග හරවාලීම පිණිස බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN) සහ තාවකාලික එකතු කළ අගය මත බදු අංක මෙම අංශය මගින් නිකුත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදි. ඒ අනුව, මෙම ඒකකය මගින් බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක 6054 ක් වර්ෂය තුළ දී නිකුත් කර ඇත. (තාවකාලික එකතු කළ අගය මත බදු අයදුම්පත් 7908 ක් අංශය විසින් නව ගොනු විවෘත කිරීම සඳහා තොරතුරු අංශය වෙත සහ බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක 6205 ක් සංස්ථාපිත අංශය වෙත ද යවා ඇත.)

තවද, බදු ගෙවන්නන් නොවන පුද්ගලයින් සඳහා නිෂ්කාශන සහතික පත් 321 ක් නිකුත් කරනු ලැබූ අතර, බදු ගෙවන්නන්ගේ යහපත උදෙසා අත් පත්‍රිකා කිහිපයක්ම පිළියෙල කිරීමට යෙදුණි. දෙපාර්තමේන්තුවේ බිම් මහලේ ස්ථාපනය කර ඇති "One Stop Shop" වෙතින් බදු ගෙවන්නන් සඳහා බදු උපදේශක සේවා සලසනු ලබන අතර, වර්ෂය තුළ දී දැනුවත් කිරීමේ වැඩ සටහන් 14 ක් සංවිධානය කරනු ලැබිණි.

## 8.2 දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතිකපත් පිළිබඳ විස්තර මතු දැක්වේ.

වගුව 34 - දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ විධානයන් හා නිෂ්කාශන සහතික

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| **නිකුත් කරන ලද විධාන** | | |
| • පොළී මත රඳවාගැනීම් බදු සම්බන්ධයෙන් බැංකුවලට | 272 | 97 |
| • නිශ්චිත ගාස්තු සම්බන්ධව | - | 7 |
| **නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකපත්** | | |
| • අර්ථ සාධක අරමුදල්ශේෂ මුදාගැනීම සම්බන්ධව | - | 125 |
| • රට හැර යන පුද්ගලයන් සම්බන්ධව | 321 | 276 |
| **නිකුත් කරන ලද වරප්‍රසාද කාඩ්පත්** | | |
| • රන් කාඩ් පත් | 102 | 157 |
| • රිදී කාඩ් පත් | 68 | 93 |
| **මෝටර් රථ ආනයනයමත බදු සහන සඳහා නිකුත් කරන ලද සහතිකපත්** | | |
| • සහතික පත් සංඛ්‍යාව | 166 | 129 |

## 8.3 විශ්ලේෂණාත්මක වාර්තා

මහ බැංකුව, ජන හාසංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව යනාදී වූ විවිධ ප්‍රභවයන්ගෙන් ලබාගන්නා ලද දත්ත විශ්ලේෂණය කරමින් දෙපාර්තමේන්තුව ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති ඒකකය විසින් විවිධ ආකාරයේ පර්යේෂණ සිදු කරයි.

ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති ඒකකය විසින් පහත සඳහන් වාර්තා වර්ෂය තුළදී පිළියෙල කරන ලදි.

1. ආංශීය හා කාර්යමය වශයෙන් සහ බදු වශයෙන් ආර්ථික දර්ශක සැලකිල්ලට ගනිමින් ආදායම් මත විශ්ලේෂණ වාර්තාව (වාර්ෂික/ කාර්තුමය/ මාසික /දෛනික)
2. මාසික සහ කාර්තුමය බදු නිල ප්‍රකාශන (2014.10.31 දක්වා)
3. 5 අංශය, 5 අංශය සහ 5 අංශය තෝරා ගනිමින් කාර්යමය කේත දත්ත පදනමක් පිළියෙල කිරීම

## 8.4 පුහුණු අංශය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද, පුහුණු පාඨමාලාවන්ට අතිරේක වශයෙන් වර්ෂය තුළ දී බදු ගෙවන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය මගින් සංවිධානය කරන ලදි.

| වගුව 35 - දැනුවත් කිරීමේ වැඩසටහන් විස්තර | | |
|---|---|---|
| විෂය | ආයතනය | සහභාගි වූ පුද්ගලයින් සංඛ්‍යාව |
| බැංකු නිලධාරීනට අභිසරණය (ඒකරාශීවීම) සම්බන්ධ ර.ගැ.බ. අදාළ කරගැනීම | ලංකා බැංකුව | 156 |
| බදුකරණය සහ අපරාධ ක්‍රියාවලීන් | පොලිස් දෙපාර්තමේන්තුව | 26 |
| වාණිජ බැංකුවල ගනුදෙනු සම්බන්ධ (ර.ගැ.බ.) අදාළ කරගැනීම | මහජන බැංකුව | 188 |
| සංස්ථා බදුකරණය සහ උ.වි.ගෙ. බදු | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 40 |
| ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන් සඳහා එ.අ.බ. | කල්මුණේ | 120 |
| ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන් සඳහා එ.අ.බ. | වව්නියාව | 160 |
| ශ්‍රී ලංකා බදු රෙජිමය | ශ්‍රී ලංකා ඇගයුම් ආයතනය | 25 |
| රැඳවුම් බදු | හැටන් නැෂනල් බැංකුව - මාතර | 50 |
| ඉදිකිරීම් ගෙවීම් සහ උ.වි.ගෙ. මත එ.අ.බ. බැදියාව | අධිකරණ අමාත්‍යාංශය | 70 |
| ව්‍යාපෘතීන් සම්බන්ධ බදුකරණ | ව්‍යාපෘති කළමනාකරණ ඉංජිනේරු සේවා කාර්යාංශය | 100 |

## 8.5 ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS)

ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) අරමුණ වන්නේ බදු ගෙවන්නන් සඳහා බදු පරිපාලනය සහ බදු අනුකූලතාවය සරල කිරීමෙහි ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහාය දැක්වීමයි. එසේම ආදායම් රැස්කිරීම සහ බදු අනුකූලතාවය ඉහළ නැංවීමෙහි ලා සහායවීම ද (RAMIS) ආදායම් පරිපාලනයේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ අපේක්ෂාවයි. එමගින් වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් බදු ගෙවන්නන් වෙත ළඟාවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අවශ්‍ය ශක්තිය ලබාදෙමින් ආදායම් රැස්කිරීමයි. ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, ඉහළ ඵලදායිත්වයක් ජනනය කරගැනීම සඳහා රාජකාරී පරිසරයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ස්වේච්ඡා අනුකූලතාවය වැඩි කිරීමේ අරමුණ ඇතිව බදු ගෙවන්නන් සඳහා වඩාත් යහපත් සේවාවක් ලසා දීමෙන් බදු දැළ පුළුල් කිරීම සහ අනුකූලතාවය වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (RAMIS) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවර 2013 වසරේ දී ගන්නා ලදි.

වසර තුළ දී RAMIS සමාරම්භක වාර්තාව සහ ව්‍යාපෘති වාර්තාව නිම කරන ලද අතර, පද්ධති අවශ්‍යතා පිරිවිතර වාර්තාව නිරීක්ෂණය සහ අනුමැතිය සඳහා මූලික කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදි.

දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටුකිරීම සහ (RAMIS) පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අන්තපරිශීලක (පාරිභෝගික) දෘඩාංග, පරිගණක, මුද්‍රක සහ පරිලෝකන උපකරණ වැනි යටිතල පහසුකම් අවශ්‍යතා ඇස්තමේන්තු කරන ලද අතර, මෙකී අවශ්‍යතා පරිපූර්ණ කරගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.

රාජකාරීන් ඉටුකිරීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඇතැම් රජයේ ආයතන සහ බැංකු වෙතින් අවශ්‍ය යම් යම් තොරතුරු රැස්කරගත යුතුව ඇත. ව්‍යාපෘතිය යටතේ ජාලය සමඟ සම්බන්ධ කරගනු ලබන බාහිර ආයතන 23 ක් සමඟ සාකච්ඡා නිම කරන ලද අතර, අදාළ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට නියමිතය.

වසර තුළ දී (RAMIS) ව්‍යාපෘතියේ පරිවර්තන (වෙනස්වීමේ) කළමනාකරණ කණ්ඩායම දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් සඳහා වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ඇත.

**2014.12.31 දිනට තක්සේරු අංශ අතර කාර්ය මණ්ඩලය සඳහා ලිපිගොනු හා ආදායම් බෙදී යාම**

| තක්සේරු අංශය | කාර්ය මණ්ඩලය | | | | | | | ලිපිගොනු | | | | | | | | ආදායම (රු. මිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කො. | නි.කො. | තක්. | ජ්‍යෙ.බ.නි. | බ.නි. | වෙනත් | එකතුව | අ.බ./ර.ගැ.බ. | කි.වෘ. | එ.අ.බ./වි.එ.අ.බ. | ජා.ගො.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | ඕ.සු./මු.බ. | රා.නො.සං. | ආ.බ./ස.ව.බ. | උ.වි.ගෙ. | ආ.සේ.ගා. | එ.අ.බ./හා.සේ.බ./වි.එ.අ.බ. | ජා.ගො.බ. | පි.බ./ඕ.සු./වෙනත් | හ.බ./කො.හු.බ. | මු.බ./ඉ.බ. | එකතුව |
| ජාත්‍යන්තර අංශය (5 බී) | 1 | - | 9 | 1 | - | 10 | 21 | 84 | 938 | 100 | 30 | 114 | 21 | - | 180 | 4,610.24 | 876.91 | 120.08 | 597.72 | 57.99 | - | - | - | 6,262.94 |
| 1 හා 2 අංශය | 2 | 1 | 18 | 2 | - | 9 | 32 | 4,304 | - | - | 9 | - | 14 | - | - | 829.50 | - | 0.32 | 2.30 | 4.97 | - | - | - | 837.08 |
| 4 අංශය | 1 | 2 | 8 | - | - | 7 | 18 | 1,025 | - | 771 | 604 | 756 | 66 | - | - | 810.15 | 314.16 | 133.91 | 1,579.62 | 663.19 | - | - | - | 3,501.04 |
| 4 ඒ අංශය | 1 | 3 | 13 | 2 | - | 9 | 28 | 5,117 | - | 926 | 2,292 | 1,394 | 22 | - | - | 695.70 | 215.21 | 83.52 | 1,438.07 | 524.02 | 0.03 | - | - | 2,956.55 |
| 5 අංශය | 1 | - | 6 | 3 | - | 9 | 19 | 862 | - | 624 | 593 | 653 | 87 | - | - | 1,002.68 | 468.59 | 240.04 | 1,581.46 | 538.27 | 0.02 | - | - | 3,831.05 |
| 5 සී අංශය | 1 | 1 | 6 | 6 | - | 7 | 21 | 4,113 | - | 1,035 | 579 | 1,005 | 39 | - | - | 886.81 | 316.42 | 143.48 | 1,139.73 | 524.02 | 0.16 | - | - | 3,010.61 |
| 12 අංශය (5 ඒ) | 1 | - | 14 | 1 | - | 7 | 23 | 904 | 7 | 880 | 514 | 764 | 767 | - | 1 | 1,905.70 | 456.97 | 188.57 | 1,613.95 | 519.63 | 3.74 | - | - | 4,688.56 |
| 5 ඩී අංශය | 1 | 1 | 11 | 3 | - | 5 | 21 | 3,821 | - | 903 | 463 | 735 | 54 | - | - | 735.79 | 229.08 | 117.51 | 1,121.21 | 373.91 | 0.14 | - | - | 2,577.64 |
| 14 අංශය | 1 | - | 8 | 10 | - | 8 | 27 | 5,557 | - | 1,882 | 684 | 780 | 14 | | - | 630.86 | 135.55 | 99.15 | 1,762.14 | 908.74 | 0.14 | - | - | 3,536.58 |
| 15 අංශය | 2 | 2 | 21 | 9 | - | 11 | 45 | 4,047 | - | 1,171 | 1,027 | 1,537 | 749 | - | - | 892.29 | 117.12 | 120.45 | 1,792.91 | 806.33 | 0.72 | - | - | 3,729.83 |
| 17 අංශය | 2 | 1 | 14 | - | - | 3 | 20 | 10,573 | - | 1,188 | 729 | 1,005 | 104 | - | - | 1,085.00 | 651.93 | 111.40 | 3,087.05 | 978.33 | - | - | - | 5,913.72 |
| සංස්ථාපිත බදු විගණන අංශය | 1 | 2 | 13 | 1 | - | 7 | 24 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 6 ඒ අංශය | 2 | 1 | 15 | 3 | - | 15 | 36 | 411 | 3 | 408 | 392 | 341 | 33 | - | - | 8,394.72 | 1,858.31 | 520.85 | 12,141.99 | 5,394.07 | - | - | - | 28,309.93 |
| 6 සී අංශය | 2 | 2 | 13 | 2 | 1 | 17 | 37 | 267 | 9 | 319 | 280 | 184 | 96 | - | - | 28,692.69 | 3,882.42 | 233.10 | 35,451.97 | 5,219.82 | - | - | - | 73,480.00 |
| 7 ඒ අංශය | 2 | 2 | 20 | 1 | - | 12 | 37 | 434 | 4 | 369 | 358 | 332 | 164 | - | - | 11,266.94 | 4,206.79 | 1,143.79 | 18,572.57 | 7,243.52 | 448.36 | - | - | 42,881.97 |
| 7 බී අංශය | 2 | 1 | 21 | - | - | 12 | 36 | 439 | - | 389 | 358 | 365 | 43 | - | - | 9,852.12 | 1,711.69 | 643.98 | 19,677.75 | 4,273.15 | 8.34 | - | - | 36,167.03 |
| 8 අංශය | 2 | 1 | 21 | 4 | - | 8 | 36 | 432 | 8 | 443 | 352 | 400 | 429 | - | - | 14,880.31 | 3,096.50 | 963.12 | 18,195.35 | 2,767.81 | 6.94 | - | - | 39,910.03 |
| 10 අංශය | 2 | 1 | 21 | 3 | - | 7 | 34 | 623 | - | 428 | 365 | 463 | 376 | - | - | 5,235.09 | 2,637.14 | 1,069.36 | 12,264.60 | 3,801.20 | 0.00 | - | - | 25,007.37 |
| විශාල බදු ගෙවන්නන්ගේ විගණන අංශය | 2 | - | 23 | 2 | - | 7 | 34 | - | - | - | - | - | - | - | - | | | | | | | | | - |
| රඳවා ගැනීමේ බදු (පොලී මත) අංශය | 1 | - | 6 | 3 | - | 5 | 15 | 2,628 | - | - | - | - | - | - | - | 70,252.16 | - | - | - | - | - | - | - | 70,252.16 |
| උ.වි.ගෙ. අංශය | 1 | - | 8 | - | - | 7 | 16 | - | - | - | - | 1,276 | - | - | - | 1,368.01 | 77.94 | - | - | - | - | 2,048.68 | - | 3,494.62 |
| ආ.සේ./ජා.ගො./ඔට්ටු හා සූදු බදු අංශය | 1 | 1 | 6 | - | - | 5 | 13 | - | - | - | - | - | - | 1,072 | - | - | - | - | - | - | 1,265.37 | - | - | 1,265.37 |
| එ.අ.බ. විශේෂ විගණන අංශය | 1 | 1 | 18 | 1 | - | 6 | 27 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. ආපසු ගෙවීම් අංශය | 4 | 2 | 23 | 2 | - | 20 | 51 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. ලියාපදිංචි අංශය | 1 | - | 6 | - | - | 10 | 17 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එ.අ.බ. විගණන අංශය | 2 | - | 28 | 1 | - | 7 | 38 | - | - | 3,670 | - | - | - | - | - | - | - | - | 4,655.69 | - | - | - | - | 4,655.69 |
| ස.එ.බ. අංශය | 2 | - | 23 | - | - | 15 | 40 | | | | | | | | | | | | | | | | | |
| ස.එ.බ. විගණන අංශය | 1 | - | 13 | - | - | 5 | 19 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ස.එ.බ. අධීක්ෂන අංශය | 1 | 1 | 2 | - | - | 1 | 5 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මුද්දර බදු අංශය | 1 | 1 | 14 | 3 | - | 7 | 26 | - | - | - | - | - | - | 8,173 | - | - | - | - | - | - | - | - | 7,923.40 | 7,923.40 |
| **ප්‍රාදේශීය කාර්යාල** | | | | | | | | | | | | | | | | | | | | | | | | - |
| කොළඹ දකුණ | 1 | 1 | 21 | 4 | - | 12 | 39 | 9,572 | - | - | 401 | - | 31 | - | - | 1,031.12 | - | 10.84 | 0.09 | 160.63 | - | - | - | 1,202.69 |
| කොළඹ මැද | 1 | 2 | 20 | 2 | - | 13 | 38 | 8,411 | - | - | 985 | - | 5 | - | - | 833.84 | - | 16.31 | - | 457.14 | - | - | - | 1,307.29 |
| කොළඹ නගර | 1 | - | 22 | 1 | - | 14 | 38 | 9,327 | - | - | 1148 | - | 11 | - | - | 768.91 | - | 10.85 | - | 485.95 | - | - | - | 1,265.71 |
| මහරගම නැගෙනහිර | 1 | - | 14 | 3 | - | 12 | 30 | 10,330 | - | - | 874 | - | 1 | - | - | 330.27 | - | 11.20 | 1.29 | 277.32 | - | - | - | 620.08 |
| මහරගම බටහිර | 1 | - | 16 | 1 | - | 11 | 29 | 10,808 | - | - | 695 | - | 2 | - | - | 356.47 | - | 7.61 | 0.35 | 238.17 | - | - | - | 602.60 |
| බදුල්ල | 1 | - | 15 | - | - | 15 | 31 | 5,747 | - | - | 534 | - | 0 | - | - | 236.52 | - | 5.58 | 0.02 | 180.18 | - | - | - | 422.30 |
| ගාල්ල | 1 | - | 18 | 4 | - | 15 | 38 | 7,047 | - | - | 542 | - | 4 | - | - | 242.82 | - | 7.72 | - | 202.59 | - | - | - | 453.13 |
| කළුතර | 1 | 1 | 17 | - | - | 20 | 39 | 8,145 | - | - | 469 | - | 0 | - | - | 225.48 | - | 2.17 | - | 175.23 | - | - | - | 402.88 |
| මාතර | - | - | 16 | 1 | - | 22 | 39 | 9,304 | - | - | 500 | - | - | - | - | 274.05 | - | 7.59 | 0.01 | 216.46 | - | - | - | 498.10 |
| නුවර එළිය | 1 | 1 | 11 | 1 | - | 15 | 29 | 4,298 | - | - | 408 | - | 3 | - | 11 | 182.99 | - | 2.33 | 0.01 | 120.10 | - | - | - | 305.44 |
| රත්නපුරය | 1 | 1 | 14 | 6 | - | 15 | 37 | 7,150 | - | - | 591 | - | 4 | - | - | 243.23 | - | 21.51 | 0.04 | 202.13 | - | - | - | 466.91 |
| අනුරාධපුරය | 1 | 1 | 15 | - | - | 17 | 34 | 4,492 | - | - | 542 | - | - | - | - | 254.66 | - | 3.55 | 0.24 | 205.52 | - | - | - | 463.97 |
| ගම්පහ | 1 | - | 18 | 1 | - | 11 | 31 | 13,636 | - | - | 874 | - | | - | - | 411.35 | - | 27.53 | 0.05 | 541.15 | - | - | - | 980.09 |
| මඩකලපුව | 1 | - | 8 | 2 | - | 17 | 28 | 4,532 | - | 74 | 923 | - | 106 | - | - | 116.19 | - | 9.20 | 1.13 | 107.92 | - | - | - | 234.44 |
| යාපනය | - | - | 2 | - | 1 | 13 | 16 | 2,321 | - | - | 420 | - | 0 | - | - | 87.17 | - | 2.43 | 0.14 | 124.05 | - | - | - | 213.80 |
| මහනුවර | 1 | - | 31 | - | - | 22 | 54 | 11,040 | - | - | 803 | - | 4 | - | - | 473.97 | - | 7.51 | 0.07 | 335.41 | - | - | - | 816.97 |
| කෑගල්ල | 1 | 2 | 16 | 1 | - | 16 | 36 | 5,848 | - | - | 395 | - | 5 | - | - | 166.19 | - | 2.46 | - | 127.41 | - | - | - | 296.06 |
| කුරුණෑගල | 1 | 1 | 25 | 2 | - | 16 | 45 | 11,338 | - | - | 601 | - | 11 | - | - | 290.89 | - | 11.85 | 0.02 | 271.22 | - | - | - | 573.98 |
| දඹුල්ල | 1 | - | 15 | 3 | - | 16 | 35 | 6,327 | - | - | 404 | - | 38 | - | - | 195.48 | - | 5.43 | - | 173.62 | - | - | - | 374.53 |
| මීගමුව | 1 | - | 16 | 1 | - | 11 | 29 | 10,839 | - | - | 818 | - | 212 | - | - | 406.56 | - | 6.12 | 0.01 | 250.80 | - | - | - | 663.48 |
| **එකතුව** | **63** | **37** | **752** | **96** | **2** | **561** | **1511** | **206,153** | **969** | **15,580** | **22,556** | **12,104** | **3,515** | **9,245** | **192** | | | | | | | | | **386,357.63** |

| | |
|---|---|
| **ආනයන මත එ.අ.බ.** | **102,235.48** |
| **ආනයන මත ජා.ගො.බ.** | **23,750.92** |
| **භාණ්ඩාගාර පැවරුම්** | **2,488.74** |
| **ආපසු ගෙවීම්** | **(1,199.61)** |
| **ගැලපුම්, වර්ගීකරණය නොකළ ආදායම, අගරු චෙක්පත් සහ අනෙකුත්** | **527.55** |
| **ශුද්ධ රැස්කිරීම් (පළාත් සභාවලට මාරු කරන ලද මුද්දර බදු සහ ජා.ගො.බ. ප්‍රමාණයෙන් 1/3 ක් ද ඇතුළත් ය.)** | **514,160.71** |